G.C.E. ADVANCED LEVEL EXAMINATION

# 2023

# PHYSICS

## SINHALA MEDIUM

**PAST PAPER**

Print-ready archive - original question pages preserved

CRYSOLABS

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

| | | | |
|---|---|---|---|
| භෞතික විද්‍යාව I<br>பௌதிகவியல் I<br>Physics I | 01 S I | | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස් :**

- ✳ මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **50**ක්, පිටු **10**ක අඩංගු වේ.
- ✳ **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිලිමත්ව කියවන්න.
- ✳ **1** සිට **50** තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයකින්** (X) **ලකුණු කරන්න.**

**ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**

$(g = 10\,\mathrm{m\,s^{-2}})$

**1.** ඉලෙක්ට්‍රෝන වෝල්ට් (eV)
(1) ශක්තියේ ඒකකයකි. (2) ක්ෂමතාවයේ ඒකකයකි.
(3) ආරෝපණයේ ඒකකයකි. (4) වෝල්ටීයතාවයේ ඒකකයකි.
(5) බලයේ ඒකකයකි.

**2.** ඒකාකාර ගෝලීය $M$ සහ $m$ ස්කන්ධ දෙකක කේන්ද්‍ර අතර දුර $r$ වේ. ස්කන්ධ දෙකේ ගුරුත්වාකර්ෂණ විභව ශක්තිය කුමක් ද?
(1) $\frac{GMm}{r}$ (2) $-\frac{GMm}{r}$ (3) $\frac{GMm}{r^2}$ (4) $-\frac{GMm}{r^2}$ (5) $-\frac{GM}{r}$

**3.** හරකෙක් කරත්තයක් ඇදගෙන යන විට හරකාගේ ඉදිරි චලිතය සඳහා පාදක වන බලය කුමක් ද?
(1) හරකා කරත්තය මත යොදන බලය (2) කරත්තය හරකා මත යොදන බලය
(3) හරකා පොළොව මත යොදන බලය (4) පොළොව හරකා මත යොදන බලය
(5) කරත්තය පොළොව මත යොදන බලය

**4.** විශාලත්ව 9m සහ 6m වූ විස්ථාපන දෙකක් එකතු කිරීමෙන් ලබාගත හැකි සම්ප්‍රයුක්ත විස්ථාපනයක් වන්නේ,
(1) 1 m. (2) 2 m. (3) 4 m. (4) 16 m. (5) 20 m.

**5.** අන්වායාම තරංග ප්‍රදර්ශනය **නොකරන්නේ**
(1) පරාවර්තනයයි. (2) වර්තනයයි.
(3) නිරෝධනයයි. (4) විවර්තනයයි.
(5) ධ්‍රැවණයයි.

**6.** කෘෂ්ණ වස්තුවක නිරපේක්ෂ උෂ්ණත්වය දෙගුණයකින් ඉහළ දැමූ විට කෘෂ්ණ වස්තුවේ ඒකක වර්ගඵලයකින් ඒකක කාලයකදී විකිරණය වන ශක්තිය
(1) දෙගුණයකින් වැඩිවේ. (2) හතර ගුණයකින් වැඩිවේ.
(3) අට ගුණයකින් වැඩිවේ. (4) දහසය ගුණයකින් වැඩිවේ.
(5) තිස්දෙක ගුණයකින් වැඩිවේ.


**7.** සංඛ්‍යාංක පරිපථවල ට්‍රාන්සිස්ටර භාවිත වන විට ඒවා ක්‍රියාත්මක වන්නේ
(1) සක්‍රිය කලාපයේ ය. (2) බිඳවැටීමේ කලාපයේ ය.
(3) රේඛීය කලාපයේ ය. (4) සන්තෘප්ත කලාපයේ ය.
(5) සන්තෘප්ත සහ කඩ හැරෙන කලාපවල ය.

**8.** නියුට්‍රෝනයක ($n$) ක්වාක් සංයුතිය කුමක් ද?
(1) uud (2) udd (3) uuu (4) $\bar{u}\bar{u}\bar{u}$ (5) $\bar{d}\bar{d}\bar{d}$




Physics Class
Dr.Theekshana Nayanajith
0763456669


**9.** පරිපූර්ණ වායුවක, දී ඇති ස්කන්ධයක පීඩනය නියතව තබා ගතහොත්, නිරපේක්ෂ උෂ්ණත්වය $T$ සමග එහි ඝනත්වය $\rho$ හි විචලනය වඩාත්ම හොඳින් නිරූපණය වන්නේ,




(1)




(2)



(3)



(4)



(5)

**10.** තාපගතික ක්‍රියාවලි තුනක් පහත දී ඇත,

(A) සමෝෂ්ණ ක්‍රියාවලියක්
(B) නියත පරිමා ක්‍රියාවලියක්
(C) නියත පීඩන ක්‍රියාවලියක්

පරිපූර්ණ වායුවකට ලබා දෙන **මුළු** තාප ශක්තියම වායුව මගින් කරන ලද කාර්යය බවට පත් කළ හැක්කේ,

(1) (A) මගින් පමණකි. (2) (B) මගින් පමණකි.
(3) (C) මගින් පමණකි. (4) (A) සහ (C) මගින් පමණකි.
(5) (A), (B) සහ (C) සියල්ල මගිනි.

**11.** සන්නායක සමාන්තර තහඩු දෙකක විද්‍යුත් විභව පිළිවෙළින් −10 V සහ 30 V වේ. තහඩු අතර පරතරය 2 cm නම් තහඩු අතර පවතින විද්‍යුත් ක්ෂේත්‍ර තීව්‍රතාවය කොපමණ ද?

(1) $1000\ \text{V m}^{-1}$ (2) $1500\ \text{V m}^{-1}$ (3) $2000\ \text{V m}^{-1}$ (4) $3000\ \text{V m}^{-1}$ (5) $4000\ \text{V m}^{-1}$

**12.** පහත කුමක් විද්‍යුත් ක්ෂේත්‍ර රේඛා පිළිබඳ සත්‍ය **නොවන්නේ** ද?

(1) ක්ෂේත්‍ර රේඛා ධන ආරෝපණවලින් පටන් ගෙන සෘණ ආරෝපණ මත නතර වේ.
(2) තනි ධන ආරෝපණයක් පැවතුනහොත් ක්ෂේත්‍ර රේඛා අනන්තයේදී නතර වේ.
(3) ක්ෂේත්‍ර රේඛා දෙකක් කිසි විටක එකිනෙක කැපී යා නොහැක.
(4) ස්ථිති විද්‍යුත් ක්ෂේත්‍ර රේඛා සංවෘත පුඩු සාදයි.
(5) විද්‍යුත් ක්ෂේත්‍රයක රටාව නිරූපණය කිරීමට යොදා ගන්නා ක්ෂේත්‍ර රේඛා මනඃකල්පිත රේඛා වේ.

**13.** තීව්‍රතාව $I_1$ වන ධ්වනි ප්‍රභවයක් එක්තරා ලක්ෂ්‍යයකදී ඇති කරන ධ්වනි තීව්‍රතා මට්ටම 90 dB වේ. තීව්‍රතාව $I_2$ වන වෙනත් ධ්වනි ප්‍රභවයක් එම ලක්ෂ්‍යයේම 40 dB ක ධ්වනි තීව්‍රතා මට්ටමක් ඇති කරයි. ප්‍රභව දෙකේම සිට ලක්ෂ්‍යයට ඇත්තේ එකම දුරකි. $\frac{I_1}{I_2}$ අනුපාතය කොපමණ ද?

(1) 5 (2) 50 (3) 500 (4) $10^2$ (5) $10^5$

**14.** ලෝහයක ප්‍රකාශ විද්‍යුත් දේහලිය සංඛ්‍යාතය $f_0$ වේ. සංඛ්‍යාතය $4f_0$ වන ආලෝකය ලෝහය මත පතනය වන විට නිකුත් වන ප්‍රකාශ ඉලෙක්ට්‍රෝනවල උපරිම චාලක ශක්තිය කුමක් ද?

(1) $hf_0$ (2) $2hf_0$ (3) $3hf_0$ (4) $4hf_0$ (5) $5hf_0$

**15.** නාභිය දුර 20 cm වන උත්තල කාචයක් සහ නාභිය දුර 5 cm වන අවතල කාචයක් ඒවා අතර පරතරය $d$ වන පරිදි එකම අක්ෂයේ තබා ඇත. උත්තල කාචය මත පතනය වන ඒකවර්ණ සමාන්තර ආලෝක කදම්බයක් අවතල කාචයෙන් සමාන්තර කදම්බයක් ලෙස නික්ම යයි නම් $d$ දුර කොපමණ ද?

(1) 25 cm (2) 20 cm (3) 15 cm (4) 10 cm (5) 5 cm

[තුන්වැනි පිටුව බලන්න.

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

Enu

**16.** ස්කන්ධය $m$ වන $X$ ට්‍රොලිය සහ ස්කන්ධය $M$ වන $Y$ ට්‍රොලිය සුමට තිරස් පෘෂ්ඨයක් මත සරල රේඛාවක් ඔස්සේ එකම දිශාවට චලිත වේ. $X$ ට්‍රොලියේ වේගය $Y$ ට්‍රොලියේ වේගය මෙන් දෙගුණයකි. ට්‍රොලි දෙක එකට ගැටුණු පසු ඒවා පොදු ප්‍රවේගයකින් එක්ව ගමන් ගනී. ගැටුම නිසා $Y$ ට්‍රොලියේ වේගය 20% කින් වැඩි වූයේ නම් $\frac{M}{m}$ අනුපාතය කොපමණ ද?

(1) 5 (2) 4 (3) 3 (4) 2 (5) 1

**17.** තිරසට $60^\circ$ ක කෝණයකින් බෝලයක් ඉහළට ප්‍රක්ෂේපණය කරනු ලැබේ. ප්‍රක්ෂේපණයේ ආරම්භක චාලක ශක්තිය $K$ නම් එහි උපරිම උසේදී බෝලයේ චාලක ශක්තිය කොපමණ වේ ද? (වාත ප්‍රතිරෝධය නොසලකා හරින්න.)

(1) $K$ (2) $\frac{K}{2}$ (3) $\frac{K}{3}$ (4) $\frac{K}{4}$ (5) 0


**18.** දිග $L$ සහ විෂ්කම්භය $d$ වන කම්බියකින් සාදා ඇති ගිල්ලුම් තාපකයකින් දෙන ලද ජල ස්කන්ධයක උෂ්ණත්වය 40 °C කින් නැංවීමට මිනිත්තු 4 ක කාලයක් ගත වේ. එම ද්‍රව්‍යයෙන් සාදන ලද එහෙත් දිග $2L$ සහ විෂ්කම්භය $2d$ වන කම්බියකින් සාදා ඇති වෙනත් ගිල්ලුම් තාපකයක් මගින් ඒ හා සමාන ජල ප්‍රමාණයක උෂ්ණත්වය 40 °C කින් නැංවීමට කොපමණ කාලයක් ගත වේ ද? (පරිසරයට වන තාප හානිය නොසලකා හරින්න.)

(1) 0·5 min (2) 1 min (3) 1·5 min (4) 2 min (5) 8 min


**19.** පෘථිවිය සූර්යයා වටා අරය $r_1$ වන වෘත්තාකාර පථයක $v_1$ වේගයකින් පරිභ්‍රමණය වන බව හා අඟහරු ග්‍රහයා සූර්යයා වටා අරය $r_2$ වන වෘත්තාකාර පථයක $v_2$ වේගයකින් පරිභ්‍රමණය වන බව උපකල්පනය කරන්න. $\frac{v_1}{v_2}$ අනුපාතය කුමක් ද?

(1) $\frac{r_1}{r_2}$ (2) $\frac{r_2}{r_1}$ (3) $\sqrt{\frac{r_2}{r_1}}$ (4) $\sqrt{\frac{r_1}{r_2}}$ (5) $\frac{r_1^2}{r_2^2}$


**20.** ප්‍රතිබිම්බ දුර ($V$) සමග උත්තල කාචයක් මගින් සෑදෙන තාත්ත්වික ප්‍රතිබිම්බවල රේඛීය විශාලනයේ ($m$) විචලනය වඩාත්ම හොඳින් නිරූපණය වන්නේ,




(1)




(2)



(3)



(4)



(5)

**21.** ධාරාවක් රැගෙන යන දිගු පරිනාලිකාවක අක්ෂය ඔස්සේ $v$ ප්‍රවේගයකින් ප්‍රෝටෝනයක් ප්‍රක්ෂේපණය කරනු ලැබුවේ නම්,


(1) අක්ෂය ඔස්සේ ප්‍රෝටෝනය ත්වරණය වේ.
(2) අක්ෂය ඔස්සේ ප්‍රෝටෝනය මන්දනය වේ.
(3) අක්ෂය වටා ප්‍රෝටෝනයේ පථය වෘත්තාකාර වේ.
(4) අක්ෂය වටා ප්‍රෝටෝනයේ පථය සර්පිලාකාර වේ.
(5) අක්ෂය ඔස්සේ ප්‍රෝටෝනය $v$ ප්‍රවේගයෙන් දිගටම චලිත වේ.

Enu

[හතරවැනි පිටුව බලන්න.


Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

**22.** ඒකාකාර අර්ධ වෘත්තාකාර තුනී තහඩුවක් රූපයේ පෙන්වයි. එහි ගුරුත්ව කේන්ද්‍රයේ පිහිටීමට වඩාත්ම ඉඩ ඇති ලක්ෂ්‍යය වනුයේ,





(1) $A$ (2) $B$ (3) $C$
(4) $D$ (5) $E$

**23.** රූපයේ පෙන්වා ඇති පරිදි ධාරාවක් රැගෙන යන සෘජු කම්බියක දෙපැත්තේ $A$ සහ $B$ සන්නායක වෘත්තාකාර පුඩු දෙකක් කම්බිය හා සමග එකම තලයක තබා ඇත. කම්බියේ ගලන ධාරාව ($I$) විශාලත්වයෙන් අඩු වන විට පුඩුවල ප්‍රේරණය වන ධාරාව




(1) $A$ හි දක්ෂිණාවර්ත සහ $B$ හි දක්ෂිණාවර්ත වේ.
(2) $A$ හි වාමාවර්ත සහ $B$ හි දක්ෂිණාවර්ත වේ.
(3) $A$ හි දක්ෂිණාවර්ත සහ $B$ හි වාමාවර්ත වේ.
(4) $A$ හි වාමාවර්ත සහ $B$ හි වාමාවර්ත වේ.
(5) පුඩු දෙකේම ශුන්‍ය වේ.

**24.** දක්ෂිණාවර්ත දිශාවට භ්‍රමණය වන කතුරු ඕංචිල්ලාවක් රූපයේ පෙන්වයි. $X$ හි පිහිටුවා ඇති ශබ්ද විකාශන යන්ත්‍රයක් මගින් $f_0$ නියත සංඛ්‍යාතයකින් යුත් ධ්වනි තරංග අනවරතව පිට කරයි. කතුරු ඕංචිල්ලාවේ සිටින මිනිසෙකු $P$, $Q$, $R$ සහ $S$ යන පිහිටුම් පසුකරන විට ඔහුට ඇසෙන ධ්වනියේ තාරතාව පිළිබඳව පහත ප්‍රකාශ සලකා බලන්න.




(A) මිනිසා $Q$ සහ $S$ ස්ථානවල ස්ථානගත වන විට ප්‍රකෘති තාරතාව ඇසේ.
(B) මිනිසා $P$ ලක්ෂ්‍යයේ ස්ථානගත වන විට උච්චතම තාරතාව ඇසේ.
(C) මිනිසා $R$ ලක්ෂ්‍යයේ ස්ථානගත වන විට අවම තාරතාව ඇසේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) (A) පමණක් සත්‍ය වේ. (2) (A) සහ (B) පමණක් සත්‍ය වේ.
(3) (A) සහ (C) පමණක් සත්‍ය වේ. (4) (B) සහ (C) පමණක් සත්‍ය වේ.
(5) (A), (B) සහ (C) යන සියල්ලම සත්‍ය වේ.

**25.** චුම්බක ක්ෂේත්‍රයක තබා ඇති ධාරාවක් රැගෙන යන කම්බියක් මත ක්‍රියාකරන චුම්බක බලයේ විශාලත්වය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) එය කම්බියේ දිග මත රඳා පවතී.
(B) එය කම්බිය නවා ඇති හැඩය මත රඳා පවතී.
(C) එය කම්බියේ හරස්කඩ වර්ගඵලය මත රඳා පවතී.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) (A) පමණක් සත්‍ය වේ. (2) (A) සහ (B) පමණක් සත්‍ය වේ.
(3) (A) සහ (C) පමණක් සත්‍ය වේ. (4) (B) සහ (C) පමණක් සත්‍ය වේ.
(5) (A), (B) සහ (C) යන සියල්ලම සත්‍ය වේ.

**26.** අභ්‍යන්තර අරය $a$ සහ දිග $l$ වන තිරස් නළයක් හරහා $\Delta p$ පීඩන අන්තරයකට යටත්ව ගලන දුස්ස්‍රාවිතා සංගුණකය $\eta$ වන ද්‍රවයක **වේගය** $v$, $v = \dfrac{Ca^n \Delta p}{\eta l}$ ලෙස ලිවිය හැක. මෙහි $C$ යනු මාන නොමැති නියතයකි. $n$ හි අගය කොපමණ ද?

(1) $\frac{1}{2}$ (2) 1 (3) 2 (4) 3 (5) 4

**27.** වානේ මිනුම් පටියක් 20 °C ක උෂ්ණත්වයකදී ක්‍රමාංකනය කොට ඇත. ශිෂ්‍යයෙක් 40 °C දී දිගක් මැනීම සඳහා මෙම මිනුම් පටිය භාවිත කරයි. මිනුම් පටියෙන් ඔහු කියවන අගය 50·00 m වේ. දිගෙහි සත්‍ය අගය කොපමණ ද? වානේවල රේඛීය ප්‍රසාරණතාව $2 \times 10^{-5}\ ^{\circ}C^{-1}$ වේ.

(1) 49·96 m (2) 49·98 m (3) 50·02 m (4) 50·04 m (5) 50·06 m


[පස්වැනි පිටුව බලන්න.

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

**28.** ඝනත්වය $\rho$ වන අසම්පීඩ්‍ය, දුස්ස්‍රාවී නොවන තරලයක් අභ්‍යන්තර අරය $r$ වන තිරස් නළයක් හරහා ගලා ගොස් අභ්‍යන්තර අරය $\frac{r}{2}$ වන නළයේ පටු කොටසකට පිවිසේ. නළයේ පළල් කොටසේදී තරලයේ පීඩනය සහ ප්‍රවේගය පිළිවෙළින් $P_0$ සහ $v_0$ නම් නළයේ පටු කොටසේදී තරලයේ පීඩනය කුමක් ද?


(1) $\frac{P_0}{4}$ (2) $\frac{P_0}{2}$ (3) $P_0 - \frac{1}{2}\rho v_0^2$ (4) $P_0 - \frac{3}{2}\rho v_0^2$ (5) $P_0 - \frac{15}{2}\rho v_0^2$

**29.** එක එකෙහි ප්‍රතිරෝධය $R$ වන ප්‍රතිරෝධක දහයක් රූපයේ පෙන්වා ඇති පරිදි සම්බන්ධ කොට ඇත. $AB$ අග්‍ර අතර ප්‍රතිරෝධය $50\,\mathrm{k\Omega}$ නම් $R$ හි අගය කොපමණ ද?




(1) $12\,\mathrm{k\Omega}$ (2) $15\,\mathrm{k\Omega}$ (3) $18\,\mathrm{k\Omega}$
(4) $24\,\mathrm{k\Omega}$ (5) $36\,\mathrm{k\Omega}$

**30.** සමපාද $P$ ප්‍රිස්මයක් තුළ ඒකවර්ණ ආලෝක කිරණයක් $D$ අවම අපගමනයකට බඳුන් වේ. එවැනි $P, Q$ සහ $R$ සර්වසම ප්‍රිස්ම තුනක් රූපයේ පෙන්වා ඇති අයුරින් තබා ඇත. ප්‍රිස්ම සංයුක්තය හරහා කිරණය ගමන් කළ පසු එහි මුළු අපගමනය කොපමණ ද?





(1) $\frac{D}{3}$ (2) $\frac{D}{2}$ (3) $D$
(4) $2D$ (5) $3D$


**31.** වර්ග මධ්‍යන්‍ය අගය 200 V වන සයිනාකාර ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතාවක් පූර්ණ තරංග සෘජුකාරක පරිපථයකට සපයනු ලැබේ. සෘජුකාරකයේ ඇති එක් එක් දියෝඩයේ ඉදිරි නැඹුරු වෝල්ටීයතාව 0·7 V වේ. සෘජුකරණය වූ වෝල්ටීයතාවයේ උච්ච අගය කොපමණ ද? ($\sqrt{2} = 1{\cdot}4$ ලෙස ගන්න.)

(1) 141·5 V (2) 142·2 V (3) 277·2 V (4) 278·6 V (5) 280·0 V


**32.** මේසයකට ඉහළින් 1 m උසක සිට පිං-පොං බෝලයක් අත හරිනු ලැබේ. සෑම අනුයාත පොළා පැනීමකදීම එකම ප්‍රමාණයකින් බෝලයේ චාලක ශක්තිය හානි වේ. පිං-පොං බෝලයේ ප්‍රවේගය ($v$) – කාලය ($t$) විචලනය හොඳින් නිරූපණය වන්නේ,





(1)





(2)




(3)




(4)





(5)



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669


**33.** සමාන්තර සන්නායක තහඩු දෙකක් හරහා වෝල්ටීයතාවක් යොදා ඇත. ස්කන්ධ පිළිවෙළින් $2m$ සහ $m$ වන $X$ සහ $Y$ ආරෝපිත බිඳිති දෙකක් රූපයේ පෙන්වා ඇති අයුරින් තහඩු අතර නිසලව ඇත. $X$ සහ $Y$ අතර ඇති අන්තර් ක්‍රියාව නොසලකා හරින්න. තහඩු දෙක එකිනෙකට සමීප කරන විට




(1) $X$ සහ $Y$ සමතුලිතතාවයේම පවතී.
(2) $X$ සහ $Y$ සමාන ත්වරණයෙන් පහළට වැටේ.
(3) $X$ සහ $Y$ සමාන ත්වරණයෙන් ඉහළට නගී.
(4) $Y$ ට වඩා වැඩි ත්වරණයකින් $X$ ඉහළට නගී.
(5) $Y$ ට වඩා වැඩි ත්වරණයකින් $X$ පහළට වැටේ.

**34.** පටු නළයක දෙකෙළවරෙහි $A$ සහ $B$ සබන් බුබුළු දෙකක් පිහිටුවා ඇත. ආරම්භයේදී නළය මැද ඇති කරාමය වසා ඇති අතර $A$ බුබුලේ අරය $B$ හි අරයට වඩා අඩු ය. ඊට පසු කරාමය විවෘත කර බුබුළු නොකැඩී පද්ධතිය සමතුලිතතාවය කරා ළඟා වීමට ඉඩ හරිනු ලැබේ. බුබුළුවල අවසාන අරයන් $(R_A, R_B)$ සහ අවසාන පරිමා $(V_A, V_B)$ අතර සම්බන්ධය කුමක් ද?


| | අවසාන අරයන් | අවසාන පරිමා |
|---|---|---|
| (1) | $R_A < R_B$ | $V_A < V_B$ |
| (2) | $R_A < R_B$ | $V_A = V_B$ |
| (3) | $R_A = R_B$ | $V_A = V_B$ |
| (4) | $R_A > R_B$ | $V_A < V_B$ |
| (5) | $R_A = R_B$ | $V_A < V_B$ |





**35.** එක්තරා $T$ උෂ්ණත්වයකදී දෙකෙළවර විවෘත නළයක් 400 Hz සංඛ්‍යාතයකින් අනුනාද වේ. උෂ්ණත්වය $T$ හිදී ට වඩා ධ්වනි වේගය 2% ක් අඩු දිනයකදී මෙම නළය අනුනාද වන සංඛ්‍යාතය කොපමණ වේ ද?


(1) 384 Hz (2) 392 Hz (3) 396 Hz (4) 408 Hz (5) 416 Hz

**36.** හොඳින් අවුරා ඇති එකම සන්නායක ද්‍රව්‍යයකින් සාදා ඇති සමාන $l$ දිගැති දඬු තුනක් සම්බන්ධ කොට රූපයේ පෙන්වා ඇති $AB$ සංයුක්ත දණ්ඩක් සාදා ඇත. දඬුවල හරස්කඩ අරයන් පිළිවෙළින් 4:2:1 අනුපාතයේ ඇත. දණ්ඩේ $A$ කෙළවරේ සිට $B$ කෙළවර දක්වා තාපය ගලයි. අනවරත අවස්ථාවේදී සංයුක්ත දණ්ඩ ඔස්සේ තාපය ගලා යෑමේ ශීඝ්‍රතාවය $\left(\frac{Q}{t}\right)$ වඩාත්ම හොඳින් නිරූපණය වන්නේ,






(1)





(2)




(3)




(4)





(5)

[හත්වැනි පිටුව බලන්න.

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669


**37.** නොසලකා හැරිය හැකි ස්කන්ධයක් ඇති එක එකෙහි ආරම්භක දිග $L$ සහ හරස්කඩ වර්ගඵලය $A$ වන යං මාපාංක $Y_1$ සහ $Y_2$ වන ද්‍රව්‍යයන්ගෙන් සාදන ලද දඬු දෙකක් ශ්‍රේණිගත ලෙස සම්බන්ධ කොට සංයුක්ත දණ්ඩක් සාදා ඇත. රූපයේ පෙන්වා ඇති පරිදි සංයුක්ත දණ්ඩේ එක් කෙළවරක් දෘඪ සිවිලිමකට ස්ථිර ලෙස සවිකොට ඇත. ඝනත්වය $\beta$ වන ද්‍රව්‍යයකින් සාදන ලද පරිමාව $V$ වන ගෝලයක් දණ්ඩේ නිදහස් කෙළවරට සම්බන්ධ කොට ගෝලය සම්පූර්ණයෙන්ම ඝනත්වය $\rho$ $(\beta > \rho)$ වන ද්‍රවයක ගිල්වනු ලැබේ. සංයුක්ත දණ්ඩේ ඇතිවන දිගෙහි වෙනස කුමක් ද?




(1) $\frac{V(\beta-\rho)gL}{A}\left(\frac{1}{Y_1}+\frac{1}{Y_2}\right)$ (2) $\frac{V(\beta-\rho)gL}{A}\left(\frac{1}{Y_1}-\frac{1}{Y_2}\right)$ (3) $\frac{A}{V(\beta-\rho)gL}\left(\frac{1}{Y_1}+\frac{1}{Y_2}\right)$

(4) $\frac{A}{V(\beta-\rho)gL}\left(Y_1-Y_2\right)$ (5) $\frac{V(\beta-\rho)gL}{A}\left(Y_1+Y_2\right)$

**38.** එකක් උඩ එකක් තබා ඇති ඝනකම් පාරදෘශ්‍ය සමාන්තර තහඩු හතරක් රූපයේ පෙන්වා ඇත. තහඩු සාදා ඇති ද්‍රව්‍යයන්ගේ වර්තනාංක පිළිවෙළින් $n_1, n_2, n_3$ සහ $n_4$ වේ. පළමු තහඩුවේ සහ දෙවන තහඩුවේ අතුරු මුහුණතේදී ඒකවර්ණ ආලෝක කිරණයක් පෙන්වා ඇති පරිදි $\theta$ පතන කෝණයකින් පතිත වේ. කිරණය තුන්වන සහ හතරවන තහඩුවල අතුරු මුහුණත ඔස්සේ යැමට නම් $\theta$ ට තිබිය යුතු අගය කුමක් ද?





(1) $\theta = \sin^{-1}\left(\frac{n_4}{n_1}\right)$ (2) $\theta = \sin^{-1}\left(\frac{n_3 n_4}{n_1}\right)$ (3) $\theta = \sin^{-1}\left(\frac{n_2 n_4}{n_1}\right)$

(4) $\theta = \sin^{-1}\left(\frac{n_2 n_3 n_4}{n_1}\right)$ (5) $\theta = \sin^{-1}\left(\frac{n_3 n_4}{n_1 n_2}\right)$

**39.** රූපයේ පෙන්වා ඇති පරිදි ධාරණාව පිළිවෙළින් $3\,\mu F$ සහ $6\,\mu F$ වන ධාරිත්‍රක දෙකක් 9 V බැටරියක් සමග ශ්‍රේණිගතව සම්බන්ධ කොට ඇත. අනවරත අවස්ථාවට ළඟා වූ පසු $3\,\mu F$ ධාරිත්‍රකය හරහා වෝල්ටීයතාව, එහි රැස් වී ඇති ආරෝපණය සහ ගබඩා වී ඇති ශක්තිය කොපමණ ද?


| | වෝල්ටීයතාව (V) | ආරෝපණය (μC) | ශක්තිය (μJ) |
|---|---|---|---|
| (1) | 3 | 9 | 27 |
| (2) | 3 | 9 | 54 |
| (3) | 3 | 18 | 108 |
| (4) | 6 | 18 | 27 |
| (5) | 6 | 18 | 54 |




**40.** පෙන්වා ඇති පරිපථයේ ඇති කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය නොගිණිය හැක. කෝෂය හරහා ගලන ධාරාව කොපමණ ද?

(1) 0·5 A (2) 1·0 A (3) 1·2 A


(4) 1·5 A (5) 2·0 A






Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

**41.** රූපයේ පෙන්වා ඇති පරිදි සැහැල්ලු දුන්නකින් සම්බන්ධ කොට ඇති $A$ සහ $B$ සර්වසම කුට්ටි දෙකක් තන්තුවක් ආධාරයෙන් සිවිලිමක එල්ලා ඇත. ආරම්භයේදී පද්ධතිය නිශ්චලතාවයේ ඇති අතර ඊට පසු තන්තුව හදිසියේ කැඩේ. තන්තුව කැඩී මොහොතකට පසු ඉහළින් ඇති $A$ කුට්ටියේ පහළ දිශාවට ඇති ත්වරණය කුමක් වේ ද?





(1) 0 (2) $\frac{g}{2}$ (3) $g$


(4) $\sqrt{2}g$ (5) $2g$

**42.** උස $h$ වන සිරස් බඳුනක $y$ උසකට ජලය අඩංගුව ඇත. ඉහළින් බැලූ විට බඳුනෙන් හරි අඩක් ජලයෙන් පිරී ඇති බව නිරීක්ෂණය වේ. ජලයේ වර්තනාංකය $\frac{4}{3}$ කි. $y$ හි අගය කුමක් ද?


(1) $\frac{1}{4}h$ (2) $\frac{1}{3}h$ (3) $\frac{1}{2}h$ (4) $\frac{4}{7}h$ (5) $\frac{3}{4}h$

**43.** රූපයේ පෙන්වා ඇති පරිපථය සලකා බලන්න. 12 V බැටරියට අභ්‍යන්තර ප්‍රතිරෝධයක් නැත. විචල්‍ය ප්‍රතිරෝධකයේ ප්‍රතිරෝධය $R$, 0 සිට 100 Ω දක්වා වෙනස් කළ හැක. $A$ සහ $B$ ලක්ෂ්‍ය අතර විභව අන්තරය මැනීම සඳහා පරිපූර්ණ මැද-බිංදු වෝල්ට්මීටරයක් භාවිත කරයි. $R$ සමග වෝල්ට්මීටර කියවීම $V$ හි විචලනය වඩාත්ම හොඳින් නිරූපණය වනුයේ,






(1)





(2)




(3)




(4)





(5)



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

44. පෙන්වා ඇති පද්ධතියේ අවිතන්‍ය සැහැල්ලු තන්තුවකින් සම්බන්ධ කොට ඇති එක එකෙහි ස්කන්ධය $M$ වූ සමාන ස්කන්ධ දෙක ඒකාකාර ප්‍රවේගයකින් චලනය වේ. කප්පිය සැහැල්ලු සහ ඝර්ෂණයෙන් තොර වේ. ආනත තලය සහ $M$ ස්කන්ධය අතර ගතික ඝර්ෂණ සංගුණකය වනුයේ




(1) $\tan\theta$  (2) $1-\sin\theta$  (3) $\frac{1-\sin\theta}{\cos\theta}$


(4) $\frac{\sin\theta-1}{\cos\theta}$  (5) $\frac{1+\sin\theta}{\cos\theta}$

45. ස්කන්ධය 1200 kg වන මෝටර් රථයක් 22 kW එන්ජින් ක්ෂමතාවකින් තිරස් සෘජු පාරක් ඔස්සේ $20\ \mathrm{m\,s^{-1}}$ නියත වේගයකින් ගමන් කරයි. සර්වසම එහෙත් තිරසට $3^{\circ}$ කෝණයකින් ආනත වූ සෘජු පාරක එම වේගයෙන්ම ඉහළට නැගීමට මෝටර් රථයේ එන්ජිමේ ක්ෂමතාව කොපමණ විය යුතු ද?
($\pi = 3$ ලෙස ගන්න. රේඩියනවලින් මැනෙන කුඩා $\theta$ කෝණ සඳහා $\sin\theta = \theta$ ලෙස ගන්න)


(1) 25 kW  (2) 34 kW  (3) 35 kW  (4) 42 kW  (5) 47 kW

46. පහත දී ඇති සත්‍යතා වගුව මගින් නිරූපණය කරන පරිපථය කුමක් ද?


| A | B | F |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 0 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |





(1)





(2)




(3)





(4)




(5)

47. රූපයේ පෙන්වා ඇති පරිදි, පැත්තක දිග 0·05 m වූ සමපාද ත්‍රිකෝණාකාර සන්නායක පුඩුවක් $v = 0{\cdot}5\ \mathrm{m\,s^{-1}}$ ඒකාකාර ප්‍රවේගයෙන් ස්‍රාව ඝනත්වය $B = 0{\cdot}1\ \mathrm{T}$ වූ ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයක් පවතින ප්‍රදේශයක් පසුකර යයි. පුඩුව ක්ෂේත්‍රයට ඇතුළු වන විට පුඩුව තුළ ප්‍රේරණය වන **උපරිම** වි.ගා. බලයේ විශාලත්වය සහ ධාරාවේ දිශාව වනුයේ කුමක් ද?






(1) 2·5 mV, වාමාවර්ත
(2) 2·5 mV, දක්ෂිණාවර්ත
(3) 0·5 mV, වාමාවර්ත
(4) 0·5 mV, දක්ෂිණාවර්ත
(5) 0·25 mV, දක්ෂිණාවර්ත



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

**48.** රූපයේ පෙන්වා ඇත්තේ $I$ ධාරාවක් රැගෙන යන සන්නායක කම්බියකි. කම්බියට එහි දිග ඔස්සේ විචලනය වන අරයක් සහිත ඒකාකාර නොවූ වෘත්තාකාර හරස්කඩ වර්ගඵලයක් ඇත. කම්බියේ වම් කෙළවරේ සිට මනින $x$ දිග සමග කම්බියේ ඉලෙක්ට්‍රෝනවල ප්ලාවිත ප්‍රවේගය $v_d$ හි විචලනය වඩාත්ම හොඳින් නිරූපණය වන්නේ,





**49.** අරය $a$ වන කුඩා සන්නායක ගෝලයක් දුස්ස්‍රාවී ද්‍රවයක් තුළ නිසලතාවයේ සිට පහළට වැටේ. ගෝලය එහි ආන්ත ප්‍රවේගය ලබා ගත් විට දුස්ස්‍රාවී බලය මගින් කෙරෙන කාර්යය කිරීමේ ශීඝ්‍රතාවය සමානුපාතික වන්නේ,

(1) $a^5$ ට ය. (2) $a^4$ ට ය. (3) $a^3$ ට ය. (4) $a^2$ ට ය. (5) $a$ ට ය.

**50.** සිවිලිමක එල්ලා ඇති ස්කන්ධය $M$ වන ඝර්ෂණයෙන් තොර විශේෂයෙන් සාදන ලද තනි කප්පියක්, අරයන් $r$ සහ $\frac{r}{2}$ වන කොටස් දෙකකින් සමන්විත වේ. රූපයේ පෙන්වා ඇති පරිදි සැහැල්ලු අවිතන්‍ය තන්තු දෙකක් කප්පියේ එක් එක් කොටස වටා ඔතා ඇති අතර ඒවායේ නිදහස් කෙළවරට එක එකෙහි ස්කන්ධය $M$ වූ කුට්ටි දෙකක් එල්ලා ඇත. අක්ෂය වටා කප්පියේ මුළු අවස්ථිති ඝූර්ණය $I$, $I = \frac{3}{4}Mr^2$ මගින් දෙනු ලැබේ. කුට්ටි නිසලතාවයේ සිට මුදා හැරිය විට කප්පියේ කෝණික ත්වරණය කුමක් ද?




(1) 0 (2) $\frac{g}{2r}$ (3) $\frac{g}{3r}$

(4) $\frac{g}{4r}$ (5) $\frac{g}{5r}$

* * *

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

**භෞතික විද්‍යාව II**
**பௌதிகவியல் II**
**Physics II**

**01 S II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ................................

**වැදගත් :**

※ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **16** කින් යුක්ත වේ.

※ මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යන කොටස් **දෙකකින්** යුක්ත වේ. **කොටස් දෙකටම** නියමිත කාලය **පැය තුනකි.**

※ ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු **නොලැබේ.**

**A කොටස - ව්‍යුහගත රචනා**
**(පිටු 2 - 8)**

**සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න. ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

**B කොටස - රචනා**
**(පිටු 9 - 16)**

මෙම කොටස ප්‍රශ්න **හයකින්** සමන්විත වන අතර ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න.

※ සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් **එක් පිළිතුරු පත්‍රයක් වන සේ, A කොටස B කොටසට උඩින්** තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාර දෙන්න.

※ ප්‍රශ්න පත්‍රයේ **B කොටස පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි**

**II පත්‍රය සඳහා**

| කොටස | ප්‍රශ්න අංක | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9(A) | |
| | 9(B) | |
| | 10(A) | |
| | 10(B) | |
| එකතුව | ඉලක්කමෙන් | |
| | අකුරෙන් | |

**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

[දෙවැනි පිටුව බලන්න.

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669


මෙම තීරයේ කිසිවක් නොලියන්න

## A කොටස – ව්‍යුහගත රචනා

ප්‍රශ්න **හතරටම** පිළිතුරු **මෙම පත්‍රයේම** සපයන්න.

$(g = 10 \text{ m s}^{-2})$

**1.** රූපයේ පෙන්වා ඇති සරල අවලම්බය භාවිත කොට ගුරුත්වජ ත්වරණය $(g)$ නිර්ණය කිරීමට ඔබට නියමව ඇත. අවලම්බයේ දෝලන දිග සීරු මාරු කළ හැක.



(*a*) මෙම පරීක්ෂණය සිදු කිරීම සඳහා අවශ්‍ය අමතර මිනුම් උපකරණ සහ අයිතම නම් කරන්න.

අමතර මිනුම් උපකරණ : ..........................................................................

අමතර අයිතම : ..........................................................................

(*b*) (i) සරල අවලම්බයක දෝලන කාලාවර්තය $(T)$ සඳහා ප්‍රකාශනයක් දෝලන දිග $(l)$ සහ ගුරුත්වජ ත්වරණය $(g)$ ඇසුරෙන් ලියා දක්වන්න.

..........................................................................

(ii) මෙම පරීක්ෂණයේ නිශ්චිත දෝලන දිග $(l)$ කුමක් ද?

..........................................................................

(*c*) (i) අවලම්බ බට්ටා දෝලනය වීම ආරම්භයට පෙර ඔබ එය නිදහස් කරන නිවැරදි ආනත කෝණය යටින් ඉරක් අඳින්න.

$1^{\circ}$ / $5^{\circ}$ / $10^{\circ}$

(ii) විරාම ඝටිකාව ක්‍රියාත්මක කරන විට දෝලන ගණන ගිණීමේ දෝෂය ඔබ මග හරවා ගන්නේ කෙසේ ද?

..........................................................................

..........................................................................

(iii) අවලම්බයේ දෝලන සිරස් තලයක සිදුවන බව ඔබ සනාථ කර ගන්නේ කෙසේ ද?

..........................................................................

..........................................................................

(*d*) (i) සුදුසු සරල රේඛා ප්‍රස්තාරයක් ඇඳීම මගින් ගුරුත්වජ ත්වරණය $(g)$ නිර්ණය කිරීම සඳහා ඉහත (*b*)(i) හි ලියා ලද ප්‍රකාශනය නැවත සකසන්න.

..........................................................................

..........................................................................


[තුන්වැනි පිටුව බලන්න.

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

Enu

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(ii) පහත ප්‍රස්තාරය භාවිත කොට ගුරුත්වජ ත්වරණය ($g$) ගණනය කරන්න. ඔබගේ පිළිතුර SI ඒකක වලින් දෙන්න. ($\pi^2 = 10$ ලෙස ගන්න.) [ඉඟිය: අනුක්‍රමණයේ අගය සුළු නොකරන්න.]




..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

($e$) රූපයේ පෙන්වා ඇති කේතුකාකාර හැඩයක් ඇති ස්කන්ධය සලකා බලන්න. ගෝලීය ස්කන්ධය වෙනුවට මෙම කේතුකාකාර හැඩය ඇති ස්කන්ධය බට්ටා සඳහා භාවිත කිරීමේ එක් වාසියක් සහ එක් අවාසියක් ලියා දක්වන්න.




වාසිය : ..........................................................................................

අවාසිය : ........................................................................................

Enu



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

Enu

මෙම තීරයේ කිසිවක් නොලියන්න

**2.** මිශ්‍රණ ක්‍රමය භාවිතයෙන් අයිස් හි විලයනයේ විශිෂ්ට ගුප්ත තාපය ($L$) නිර්ණය කිරීමට ඔබට නියමව ඇත. තඹ කැලරිමීටරයක්, උෂ්ණත්වමාන තුනක් (වඩාත්ම යෝග්‍ය උෂ්ණත්වමානය ඔබ තෝරා ගත යුතු ය), කාමර උෂ්ණත්වයේ ඇති ජලය, 0 °C ඇති අයිස් කුට්ටියක් සහ පෙරහන් කඩදාසි ඔබට සපයා ඇත.

($a$) මෙම පරීක්ෂණය සිදු කිරීම සඳහා ඔබට අවශ්‍ය අනෙක් මිනුම් උපකරණය සහ අයිතමය කුමක් ද?

මිනුම් උපකරණය: ..........................................................................................

අයිතමය: ..........................................................................................

($b$) අයිස් එකතු කිරීමට පෙර වායුගෝලයේ තුෂාරාංකය දළ වශයෙන් නිර්ණය කිරීම උචිත වේ. මෙයට හේතුව කුමක් ද?

..........................................................................................

..........................................................................................

($c$) පරීක්ෂණාගාරයේ තිබෙන උෂ්ණත්වමාන ($P$, $Q$ සහ $R$) තුනෙහි විශාල කරන ලද පරිමාණ කොටස් සහ ඒවායේ පරාස රූපයේ පෙන්වා ඇත.




| $P$ | $Q$ | $R$ |
|---|---|---|
| −10 °C සිට 60 °C දක්වා | −10 °C සිට 110 °C දක්වා | −10 °C සිට 250 °C දක්වා |

(i) කාමර උෂ්ණත්වය 30 °C සහ වාතයේ තුෂාරාංකය 24 °C නම් මෙම පරීක්ෂණය සිදු කිරීම සඳහා භාවිත කළ යුතු වඩාත්ම යෝග්‍ය උෂ්ණත්වමානය තෝරා ගන්න.

වඩාත්ම යෝග්‍ය උෂ්ණත්වමානය: ..........................................................................................

(ii) ඉහත ($c$) (i) හි තෝරාගත් උෂ්ණත්වමානයේ කුඩාම මිනුම කුමක් ද?

කුඩාම මිනුම: ..........................................................................................

(iii) ජලයේ ආරම්භක උෂ්ණත්වය කුමක් විය යුතු ද?

..........................................................................................

($d$) $L$ නිර්ණය කිරීමට උචිත ක්‍රියා පිළිවෙළ සාක්ෂාත් කර ගැනීම සඳහා අයිස් පිළියෙල කිරීමේදී, අයිස් ජලයට එකතු කිරීමේදී සහ මිශ්‍ර කිරීමේදී ඔබ ගන්නා පියවර මොනවා ද?

අයිස් පිළියෙල කිරීම : ..........................................................................................

..........................................................................................

අයිස් එකතු කිරීම : ..........................................................................................

..........................................................................................

අයිස් මිශ්‍ර කිරීම : ..........................................................................................

..........................................................................................

Enu



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669


මෙම තීරයේ කිසිවක් නොලියන්න

(*e*) (i) මෙම පරීක්ෂණයේදී ඔබ ගැනීමට බලාපොරොත්තු වන උෂ්ණත්ව මිනුම් මොනවා ද? එම මිනුම් අනුපිළිවෙළට දෙන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(ii) ඉහත (*e*) (i) හි සඳහන් දෙවන උෂ්ණත්වය නිවැරදිව මැනීම සඳහා කාලය ($t$) සමග ජලයේ උෂ්ණත්වයේ ($\theta$) විචලනය ඔබට ප්‍රස්තාර ගත කළ හැක. ඔබ බලාපොරොත්තු වන වක්‍රයේ දළ සටහනක් දී ඇති අක්ෂ භාවිතයෙන් අඳින්න.




(*f*) ඉහත (*e*) (i) හි සඳහන් කරන ලද උෂ්ණත්ව මිනුම් සහ අවශ්‍ය ස්කන්ධ මිනුම් හැර $L$ නිර්ණය කිරීම සඳහා ඔබට අවශ්‍ය දත්ත මොනවා ද?

(i) ..........................................................................................................

(ii) ..........................................................................................................

(*g*) (i) එකතු කරන ලද අයිස් සමග $0\ ^\circ C$ ජලය අඩංගු වී තිබුණේ නම් $L$ හි පරීක්ෂණාත්මක අගය සම්මත අගයට වඩා වැඩිවේ ද? නැතහොත් අඩුවේ ද?

වැඩිවේ/අඩුවේ. (නිවැරදි වචනය යටින් ඉරක් අඳින්න.)

(ii) ඔබගේ පිළිතුරට හේතු දෙන්න.

..........................................................................................................

..........................................................................................................

**3.** වස්තු කූරක **තාත්ත්වික** ප්‍රතිබිම්බයට ඇති දුර මනිමින් උත්තල කාචයක නාභීය දුර නිර්ණය කිරීම සඳහා ශිෂ්‍යයෙක් පරීක්ෂණයක් සැලසුම් කරයි.

(*a*) වස්තු දුර සඳහා සුදුසු අගයන් තෝරා ගැනීමට පෙර කාචයේ දළ නාභීය දුර ශිෂ්‍යයා දැන ගත යුතු ය. දළ නාභීය දුර ඔහු සොයා ගන්නේ කෙසේ ද?

..........................................................................................................

..........................................................................................................

(*b*) වස්තු දුර = $u$, ප්‍රතිබිම්බ දුර = $v$ සහ නාභීය දුර = $f$ ලෙස ගෙන මෙම පරීක්ෂණයේදී ශිෂ්‍යයා භාවිත කිරීමට යන සමීකරණය ලියා දක්වන්න.

..........................................................................................................

(*c*) සරල රේඛා ප්‍රස්තාර‍යක් ලබා ගැනීම සඳහා ඉහත (*b*) හි සමීකරණය නැවත සකසන්න.

..........................................................................................................

[හයවැනි පිටුව බලන්න.

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

මෙම තීරුවේ කිසිවක් නොලියන්න

(*d*) පරීක්ෂණයේ පාඨාංක ලකුණු සම්මුතිය භාවිත කොට ප්‍රස්තාරගත කළේ නම් ස්වායත්ත සහ පරායත්ත විචල්‍යයන් යථා පරිදි සලකුණු කරමින් බලාපොරොත්තු වන ප්‍රස්තාරය පහත දී ඇති ඉඩෙහි අඳින්න.

(*e*) කාචයේ නාභීය දුරෙහි දළ අගය 12 cm නම්, අවම වස්තු දුරෙහි අගය 16·7 cm සහ උපරිම වස්තු දුරෙහි අගය 100 cm ලෙස ගෙන අවම සහ උපරිම අගයන් අතර සුදුසු වස්තු දුරවල් **හතරක්** (4) ලියා දක්වන්න. පරීක්ෂණාගාර මේසයේ දිග 200 cm කි. ($0{\cdot}167\times 6=1{\cdot}0$ ලෙස ඔබට භාවිත කළ හැක.)

..........................................................................................................


..........................................................................................................

(*f*) වෙනත් ශිෂ්‍යයෙක් වස්තු දුර ලෙස $u=12{\cdot}5$ cm ගත් විට ඔහුට ප්‍රතිබිම්බ දුරක් මැනීමට නොහැකි විය. නිසි පැහැදිලි කිරීම සමග මේ සඳහා හේතුව දෙන්න.

..........................................................................................................

..........................................................................................................

(*g*) නාභීය ලක්ෂ්‍ය දෙකම, වස්තු කුර $O$, නිවේශන කුර $L$, ඇසෙහි පිහිටීම සහ තවත් වැදගත් අයිතමයක් සලකුණු කරමින් පරීක්ෂණාගාර ඇටවුමේ පහත රූප සටහන සම්පූර්ණ කරන්න.



(*h*) එක්තරා ශිෂ්‍යයෙකු $u$ අගයන් තුනක් පමණක් මැන දත්ත ලක්ෂ්‍ය 6ක් සහිත ප්‍රස්තාරයක් අඳින ලදී. ඔහු ප්‍රස්තාරය ඇඳීමට යොදා ගත් ක්‍රියාපටිපාටිය හේතුව දක්වමින් සඳහන් කරන්න.

ක්‍රියාපටිපාටිය : ..........................................................................................................

..........................................................................................................

හේතුව : ..........................................................................................................


..........................................................................................................

[හත්වැනි පිටුව බලන්න.

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

මෙම තීරයේ කිසිවක් නොලියන්න

**4.** ($a$) දෙන ලද ඒකාකාර කම්බියක ද්‍රව්‍යයේ ප්‍රතිරෝධකතාව සහ කම්බියේ දිග නිර්ණය කිරීමට (1) රූපයේ පෙන්වා ඇති මීටර සේතු පරිපථය භාවිත කරයි. සේතුවේ පළමු හිදැස හරහා දන්නා $R$ ප්‍රතිරෝධයක් සම්බන්ධ කොට ඇත. සේතුවේ දෙවන හිදැස හරහා සම්බන්ධ කොට ඇති නොදන්නා ප්‍රතිරෝධය $S$ ලෙස ගනිමු. සංතුලිත දිග $l$ වේ නම්, මීටර සේතු කම්බියේ ආන්ත ශෝධන නොසලකා හරිමින් $S$ සඳහා ප්‍රකාශනයක් $R$ සහ $l$ ඇසුරෙන් ලියා දක්වන්න.





(1) රූපය

$S$ = ................................................................................................

................................................................................................

($b$) (2) රූපයේ පෙන්වා ඇති පරිදි කම්බියේ $XZ$ කොටස පෙට්ටියක් තුළ ආවරණය කොට ඇති අතර $XY$ කොටස පෙට්ටියට පිටතින් ඇත. නොදන්නා $S$ ප්‍රතිරෝධය ලබා ගන්නේ $XZ$ දිගෙන් සහ $XY$ කම්බියේ කොටසකිනි.




(2) රූපය

(i) ආවරණය කොට ඇති $XZ$ කම්බියේ දිග $L$ වේ. $X$ සිට මනින ලද කම්බි කොටසේ දිග $x$ ද, කම්බියේ ඒකක දිගක ප්‍රතිරෝධය $k$ ද නම් සේතුවේ දෙවන හිදැස හරහා ඇති ප්‍රතිරෝධය $S$ සඳහා ප්‍රකාශනයක් $L$ , $x$ සහ $k$ ඇසුරෙන් ලියා දක්වන්න.

................................................................................................

(ii) දිග $x$ වෙනස් කිරීමෙන් අනුරූප සංතුලිත දිග $l$ මනිනු ලැබේ. $x = 10\,\text{cm}$ වන විට $l = 50\,\text{cm}$ සහ $x = 30\,\text{cm}$ වන විට $l = 40\,\text{cm}$ වේ. ඉහත ($b$)(i) හි $S$ සඳහා ලබාගත් ප්‍රකාශනය ඉහත ($a$) හි ලියන ලද ප්‍රකාශනයට ආදේශ කිරීමෙන් සහ $x$ හා $l$ සඳහා දී ඇති අගයන් භාවිත කොට $L$ නිර්ණය කරන්න.

................................................................................................

................................................................................................

................................................................................................

................................................................................................

................................................................................................

................................................................................................

................................................................................................

................................................................................................

[අවවැනි පිටුව බලන්න.

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

Enu

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(iii) $R=10\,\Omega$ නම් $k$ හි අගය නිර්ණය කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

(*c*) සුදුසු මිනුම් උපකරණයක් භාවිත කරමින් කම්බියේ ආවරණය නොවූ කොටසේ කිහිප තැනකින් කම්බියේ විෂ්කම්භය මනින ලද අතර එහිදී ලබා ගත් පාඨාංක වන්නේ 1·60 mm, 1·62 mm, 1·60 mm සහ 1·58 mm ය.

(i) මෙම මිනුම් සඳහා භාවිත කළ මිනුම් උපකරණය කුමක් ද?

..........................................................................................

(ii) ඉහත උපකරණයේ කුඩාම මිනුම mm වලින් කොපමණ ද?

..........................................................................................

(iii) ඉහත පාඨාංක භාවිත කොට කම්බියේ මධ්‍යන්‍ය හරස්කඩ වර්ගඵලය ($m^2$ වලින්) ගණනය කරන්න. $\pi=3$ ලෙස ගන්න.

..........................................................................................

..........................................................................................

(iv) කම්බියේ ද්‍රව්‍යයේ ප්‍රතිරෝධකතාව $\rho$ ගණනය කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

(*d*) ද්‍රව්‍යයක ප්‍රතිරෝධකතාව ප්‍රකාශ කිරීමේදී සඳහන් කළ යුතු අත්‍යවශ්‍ය පරාමිතිය කුමක් ද?

..........................................................................................

Enu

* *

Enu



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

භෞතික විද්‍යාව II
பௌதிகவியல் II
Physics II


**B කොටස – රචනා**

**01 S II**

ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
($g = 10 \text{ m s}^{-2}$)

- සටහන: උදාහරණයක් වශයෙන් 65210 සංඛ්‍යාව දශම ස්ථාන දෙකකට වැටයූ පසු $6{\cdot}52 \times 10^4$ ලෙස විද්‍යාත්මක අංකනයෙන් (scientific notation) ලිවිය හැක.

5. (*a*) ක්‍රිකට් තරගයකදී වේගපන්දු යවන්නෙක් (1) රූපයේ දැක්වෙන පරිදි පොළොව මට්ටමේ සිට 2·0 m උසින් $35{\cdot}0 \text{ m s}^{-1}$ තිරස් ප්‍රවේගයකින් පොළොවේ නොවදින (ෆුල් ටොස්/full toss) පන්දුවක් යොමු කරයි. පන්දුව පිත්තේ වැදීමට පෙර 17·5 m ක තිරස් දුරක් ගමන් කරයි. වායු ප්‍රතිරෝධයක් නොමැති බව උපකල්පනය කරන්න.




(1) රූපය


(i) පන්දුව පිත්තේ වැදීමට කොපමණ කාලයක් ගතවේ ද?

(ii) පන්දුව පිත්තේ වැදීම සිදු වන්නේ පොළොවේ සිට කුමන උසකින් ද?

(iii) පිත්තේ වැදීමට මොහොතකට පෙර පන්දුවේ වේගය ගණනය කරන්න. ඔබේ පිළිතුර $\text{m s}^{-1}$ වලින් ආසන්නතම පළමු දශම ස්ථානයට දෙන්න. $\sqrt{2} = 1{\cdot}41$ ලෙස ඔබට ගත හැක.

(iv) පිත්තට ලම්බකව පැමිණෙන පන්දුවට පිතිකරු සාර්ථක පහරක් දුන් විට, පන්දුව පිත්තට ළඟා වූ වේගයෙන්ම එය පැමිණි රේඛාව ඔස්සේම නැවත ආපසු හැරී ගමන් කරයි. පන්දුවේ ස්කන්ධය 0·16 kg සහ පිත්ත සමග පන්දුවේ ස්පර්ශ කාලය 0·2 s නම් පිත්තෙන් පන්දුව මත යෙදෙන බලය ගණනය කරන්න. ඔබේ පිළිතුර N වලින් ආසන්නතම පළමු දශම ස්ථානයට දෙන්න.

(*b*) ක්‍රිකට් පිතිකරුවන් තම කුසලතා වැඩි දියුණු කර ගැනීම පිණිස දැල් ආවරණයක පුහුණුවීම් සඳහා යාන්ත්‍රික පන්දු යැවීමේ යන්ත්‍ර භාවිත කරයි. එක්තරා පන්දු යැවීමේ යන්ත්‍රයක්, රබර් ටයර සවි කර ඇති *A* සහ *B* සර්වසම බර රෝද දෙකකින් සමන්විත වේ. ටයර සමග රෝද වල අරය $R = 50$ cm වේ. යන්ත්‍රය දෙස ඉහළින් බැලූ විට පෙනෙන ආකාරය (2) රූපයේ දැක්වේ. එක් එක් රෝදය එයට සම්බන්ධ විදුලි මෝටරයකින් ප්‍රතිවිරුද්ධ දිශාවලට භ්‍රමණය වේ. රෝද දෙක අතර පරතරයක් තිබෙන පරිදි **තිරස් තලයක** ඒවා සවිකර ඇත. විශේෂයෙන් නිර්මාණය කරන ලද ඒකාකාර පන්දුවක විෂ්කම්භයට වඩා මෙම පරතරය ස්වල්පයක් කුඩා ය.




(2) රූපය

(i) දඟ පන්දුවක් (spinning ball) යැවීම සඳහා *A* සහ *B* රෝදවල භ්‍රමණ වේගය පිළිවෙළින් $\omega_1 = 640$ rpm සහ $\omega_2 = 560$ rpm ලෙස සකසා ඇති අතර රෝදවල තලය තිරස්ව තබා ඇත. විනාඩියට භ්‍රමණ සංඛ්‍යාව rpm මගින් දෙනු ලැබේ. පන්දුවේ ස්කන්ධ කේන්ද්‍රයේ (CM) රේඛීය ප්‍රවේගය $v = \dfrac{(v_1 + v_2)}{2}$ මගින් දෙනු ලැබේ. පන්දුවේ කෝණික ප්‍රවේගය $\omega = \dfrac{(v_1 - v_2)}{2r}$ මගින් දෙනු ලබන අතර මෙහි $r$ යනු පන්දුවේ අරය වේ. $v_1$ සහ $v_2$ යනු ස්පර්ශක ස්ථානවල පන්දුවෙ මතුපිට ප්‍රවේගයි. පන්දුවේ අරය $r = 4{\cdot}0$ cm වේ. $\pi = 3$ ලෙස ගන්න.

I. රෝදවල කෝණික ප්‍රවේග ($\omega_1$ සහ $\omega_2$) $\text{rad s}^{-1}$ වලින් ගණනය කරන්න.

II. නිකුත් වන විට පන්දුවේ ස්කන්ධ කේන්ද්‍රයෙහි (CM හි) රේඛීය ප්‍රවේගය ($v$) ගණනය කරන්න.

III. නිකුත් වන විට පන්දුවේ කෝණික ප්‍රවේගය ($\omega$) rpm වලින් ගණනය කරන්න.



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

IV. පන්දුවේ ස්කන්ධය $m$ නම්, නිකුත්වන විට පන්දුවේ සම්පූර්ණ චාලක ශක්තිය සඳහා ප්‍රකාශනයක් $m, r, v$ සහ $\omega$ ඇසුරෙන් ලියන්න. අරය $r$ වූ ඒකාකාර පන්දුවක කේන්ද්‍රය හරහා යන අක්ෂයක් වටා අවස්ථිති ඝූර්ණය $I = \frac{2}{5}mr^2$ මගින් දෙනු ලැබේ.

V. පන්දුව නිකුත් වන විට පන්දුවේ පෘෂ්ඨයේ ලක්ෂ්‍යයකට තිබිය හැකි **උපරිම** වේගය ගණනය කරන්න.


(ii) දඟ නොකැවෙන වේග පන්දුවක් යැවීම සඳහා රෝදවල කෝණික වේග $\omega_1 = \omega_2 = \omega_0$ ලෙස සමාන වන පරිදි සකසා ඇත. වේග පන්දුවක් $35\,\mathrm{m\,s^{-1}}$ ප්‍රවේගයෙන් නිකුත් කිරීමට එක් එක් රෝදයෙහි කෝණික වේගය $\omega_0$ හි අගය rpm වලින් කුමක් විය යුතු ද?

**6.** පහත ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිස් කණෙහි ශ්‍රව්‍ය පරාසය 20 Hz සිට 20 kHz දක්වා පැතිර පවතී. අතිධ්වනි (ultrasound) තරංග ද ධ්වනි තරංග වන අතර ඒවා ශ්‍රව්‍ය ධ්වනියෙන් වෙනස් වන්නේ සංඛ්‍යාතයෙන් පමණි. කර්මාන්ත, වෛද්‍ය, නෞකා ගමනය, ප්‍රතිරූපණය (imaging), පිරිසිදු කිරීම, මිශ්‍ර කිරීම, සන්නිවේදනය සහ පරීක්ෂා කිරීම වැනි විවිධ ක්ෂේත්‍රවල අතිධ්වනි තරංග භාවිත කරයි.

අතිධ්වනික පාරනායකයක්, (transducer) විද්‍යුත් සංඥා අතිධ්වනි තරංග බවට සහ අතිධ්වනි තරංග විද්‍යුත් සංඥා බවට පරිවර්තනය කරයි. පාරනායකයේ ප්‍රධාන උපාංගය වන්නේ පීඩවිද්‍යුත් (piezoelectric) ආචරණ මූලධර්මයට අනුව ක්‍රියාකරන පීඩවිද්‍යුත් ස්ඵටිකයයි. මෙවැනි පීඩවිද්‍යුත් ස්ඵටිකයක් හරහා අධි සංඛ්‍යාත ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතාවයක් යෙදූ විට අතිධ්වනි තරංග නිපදවමින් එය එක් අක්ෂයක් ඔස්සේ ප්‍රසාරණය සහ සංකෝචනය වේ. එලෙසම අතිධ්වනි තරංග මගින් ස්ඵටිකයට විචල්‍ය පීඩනයක් යෙදූ විට ස්ඵටිකය හරහා කුඩා විභව අන්තරයක් ගොඩ නැගේ. එම නිසා එකම පාරනායකය අතිධ්වනි තරංග උපදවීමට සහ පරාවර්තිත අතිධ්වනි තරංග අනාවරණය කිරීමට භාවිත කරයි.


වෙනස් මාධ්‍ය දෙකක් අතර ඇති මායිමට අතිධ්වනි තරංග පතනය වූ විට කොටසක් පරාවර්තනය වන අතර කොටසක් සම්ප්‍රේෂණය වේ. පරාවර්තනය හෝ සම්ප්‍රේෂණය වන ප්‍රමාණය එක් එක් මාධ්‍යයේ ධ්වනික සම්බාධනය (Z) (acoustic impedance) නමින් හැඳින්වෙන ගුණය මත රඳා පවතින අතර ඒය $Z = \rho v$ සම්බන්ධතාව මගින් දෙනු ලබයි. මෙහි $\rho$ යනු මාධ්‍යයේ ඝනත්වය වන අතර $v$ යනු එම මාධ්‍යය තුළ අතිධ්වනි තරංගවල වේගයයි. අභිලම්බ පතනයක් සඳහා පතන තීව්‍රතාවයට ($I_i$), පරාවර්තන තීව්‍රතාවය ($I_r$) දරන අනුපාතය $\frac{I_r}{I_i} = \frac{(Z_2 - Z_1)^2}{(Z_2 + Z_1)^2}$ මගින් දෙනු ලබයි. මෙහි $Z_1$ සහ $Z_2$ යනු පිළිවෙළින් පළමු මාධ්‍යයේ සහ දෙවන මාධ්‍යයේ ධ්වනික සම්බාධනයි.



(1) රූපය

අතිධ්වනික පාරනායකයක් රෝගියකුගේ සම මත කෙළින්ම තැබුවොත් සමේ $Z$ අගය වාතයේ එම අගයට වඩා විශාල බැවින් පතනය වන අතිධ්වනි තීව්‍රතාවයෙන් 99·9% පරාවර්තනය වන අතර සිරුර තුළට සම්ප්‍රේෂණය වන්නේ 0·1% පමණි. අතිධ්වනි තරංග වැඩි ප්‍රමාණයක් රෝගියා තුළට සම්ප්‍රේෂණය සහතික කිරීම සඳහා රෝගියාගේ සම සහ පාරනායකය අතර විශේෂිත ජෙල් ස්තරයක් ආලේප කරනු ලැබේ. ජෙල්වල $Z$ අගය සමේ එම අගයට බොහෝ සෙයින් සමාන වන බැවින් පරාවර්තනය වන අතිධ්වනි ප්‍රමාණය අල්ප වන අතර එමගින් අභ්‍යන්තර ව්‍යුහ ඵලදායී ලෙස ප්‍රතිරූපණය කර ගත හැක.

රෝගියෙකුගේ සිරුරේ කොටසක් හරහා ඇති හරස්කඩක් (1) රූපයේ පෙන්වයි. එම කොටසේ මධ්‍යය හරහා අතිධ්වනි තරංග ස්පන්ද (pulses) යවන අතර ඒවා පළමුවෙන් අවයවයක් හරහා ගොස් ඊළඟට අස්ථියක් හරහා යයි. ජෙල්-සම මායිමෙන් ද, පළමුවෙන් අවයවයේ සහ ඊළඟට අස්ථියේ ඉදිරි සහ පසුපස පෘෂ්ඨවලින් ද පරාවර්තනය වන අතිධ්වනි තරංග සංඥාවල දෝලනේක්ෂයකින් (oscilloscope) ලබාගත් අනුරේඛනයක් (trace) (2) රූපයේ පෙන්වයි.



(2) රූපය

(*a*) මිනිස් කණෙහි ශ්‍රව්‍ය පරාසය කුමක් ද?

(*b*) අතිධ්වනි තරංග භාවිත වන ක්ෂේත්‍ර **තුනක්** නම් කරන්න.

(*c*) අතිධ්වනික පාරනායකයක කාර්යයන් මොනවා ද?

(*d*) (i) අතිධ්වනික පාරනායකයක අතිධ්වනි තරංග නිපදවෙන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) අතිධ්වනික පාරනායකයක ඇති පීඩවිද්‍යුත් ස්ඵටිකයේ ස්වාභාවික සංඛ්‍යාතය 48 kHz නම් ස්ඵටිකය හරහා යෙදිය යුතු ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතාවයේ ඉතාමත් යෝග්‍ය සංඛ්‍යාතය කුමක් ද? ඔබේ පිළිතුරට හේතුව දෙන්න.

(*e*) මාධ්‍යයක ධ්වනි වේගය සෙවීම සඳහා යොදාගන්නා සමීකරණයම එම මාධ්‍යයේම ප්‍රගමනය වන අතිධ්වනි තරංගවල වේගය නිර්ණය කිරීමට භාවිත කළ හැකි ද? ඔබේ පිළිතුරට හේතුව දෙන්න.



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

(f) (i) $\frac{I_r}{I_i} = \frac{(Z_2 - Z_1)^2}{(Z_2 + Z_1)^2}$ ප්‍රකාශනයේ, $I_r$ හි මානය $(Z_2 - Z_1)^2$ හි මානයට සමාන **නොවන** බව පෙන්වන්න.

(ii) $Z_2 = Z_1$ වන විට $\frac{I_r}{I_i}$ හි අගය කුමක් වේ ද?

(iii) $Z_2 >> Z_1$ වන විට $\frac{I_r}{I_i}$ හි අගය කුමක් වේ ද?

(g) රෝගියාගේ සම සහ පාරනායකය අතර විශේෂ ජෙල් වර්ගයක් ආලේප කිරීමට හේතුව කුමක් ද?

(h) (i) මනුෂ්‍ය හිස්කබලේ ඝනත්වය $1600\,\text{kg m}^{-3}$ වන අතර හිස්කබල තුළ අතිධ්වනි තරංග $3750\,\text{m s}^{-1}$ වේගයකින් ගමන් කරයි නම් හිස්කබලේ ධ්වනික සම්බාධනය $Z$ කොපමණ ද?

(ii) මොළය සෑදී ඇති ද්‍රව්‍යයේ සාමාන්‍ය ධ්වනික සම්බාධනය $4{\cdot}0 \times 10^6\,\text{kg m}^{-2}\text{s}^{-1}$ වේ. හිස්කබල සහ මොළය මායිම මත අතිධ්වනි තරංග පතනය වන විට $\frac{I_r}{I_i}$ හි ප්‍රතිශතය ගණනය කරන්න.

(i) (i) අවයවය තුළ අතිධ්වනි තරංග ගමන් ගන්නා සම්පූර්ණ කාල අන්තරය (2) රූපයේ දී ඇති තොරතුරු ඇසුරෙන් නිර්ණය කරන්න.

(ii) අවයවය තුළ අතිධ්වනි තරංග ගමන් කරන සම්පූර්ණ දුර ගණනය කරන්න. අවයවය තුළ අතිධ්වනි තරංගවල වේගය $1600\,\text{m s}^{-1}$ වේ.


(iii) එනයින්, අවයවයේ ඝනකම ගණනය කරන්න.

(iv) අස්ථියේ ඝනකම ගණනය කරන්න. අස්ථිය තුළ අතිධ්වනි තරංගවල වේගය $4100\,\text{m s}^{-1}$ වේ.

(j) වෛද්‍ය ප්‍රතිරූපණවලදී සන්තති අතිධ්වනි කදම්බයක් වෙනුවට අතිධ්වනි ස්පන්ද යැවීමේ හේතුව කුමක් ද?

(k) දරු ගැබක කලලයක් පරීක්ෂා කිරීමේදී X-කිරණවලට වඩා අතිධ්වනි තරංග පරිලෝකනය (scan) සුරක්ෂිත වන්නේ ඇයි?

**7.** රූපයේ දැක්වෙන පරිදි සිලින්ඩරාකාර සිරින්ජයකට සිලින්ඩරාකාර එන්නත් කටුවක් සම්බන්ධ කොට එය රෝගියකුගේ ශිරාවකට දියර ඖෂධයක් එන්නත් කිරීමට භාවිත කරයි. සිරින්ජය සහ එන්නත් කටුව යන දෙකම තිරස්ව තබා සම්පූර්ණයෙන් ඖෂධයෙන් පුරවා ඇත. සිරින්ජයේ අභ්‍යන්තර අරය $r_1$ වන අතර $X$ සහ $Y$ ලක්ෂ්‍ය අතර දිග $l_1$ වේ. එන්නත් කටුවේ අභ්‍යන්තර අරය $r_2$ වන අතර එන්නත් කටුවේ දිග $l_2$ වේ. ඖෂධයේ දුස්ස්‍රාවිතා සංගුණකය $\eta$ වේ. සිරින්ජයේ පිස්ටනයට $F$ බලයක් යෙදූ විට පද්ධතිය තුළින් ඖෂධය ගලා යෑමේ පරිමා ශීඝ්‍රතාවය $Q$ වේ. එන්නත් කටුවේ $Z$ කෙළවර ශිරාව තුළට ඇතුළු කොට ඇත.




(a) පටු තිරස් නළයක් තුළින් ගමන් කරන දුස්ස්‍රාවී ද්‍රවයක පරිමා ප්‍රවාහ ශීඝ්‍රතාවය $Q$ සඳහා පොයිසෙල් සමීකරණය ලියා දක්වන්න. සමීකරණයේ එක් එක් සංකේතය හඳුන්වන්න.

(b) (i) යොදන බලය හේතුවෙන් $X$ ලක්ෂ්‍යයේ ඇතිවන පීඩනය $P$ සඳහා ප්‍රකාශනයක් $F$ සහ $r_1$ ඇසුරෙන් ලියා දක්වන්න. පිස්ටනයේ හරස්කඩ වර්ගඵලය මත $F$ බලය ඒකාකාරව ව්‍යාප්ත වී ඇතැයි උපකල්පනය කරන්න.

(ii) වායුගෝලීය පීඩනය $P_0$ නම් $X$ ලක්ෂ්‍යයේ මුළු පීඩනය $P_1$ කුමක් ද?

(iii) $Y$ ලක්ෂ්‍යයේ පීඩනය $P_2$ නම් $(P_0 - P_2)$ සඳහා ප්‍රකාශනයක් $Q, r_1, l_1, \eta$ සහ $F$ ඇසුරෙන් ලියා දක්වන්න.

(iv) $Z$ ලක්ෂ්‍යයේ (ශිරාව තුළ) පීඩනය $P_3$ නම් $(P_2 - P_3)$ සඳහා ප්‍රකාශනයක් $Q, r_2, l_2$ සහ $\eta$ ඇසුරෙන් ලියා දක්වන්න.

(v) ඉහත (b)(iii) සහ (b)(iv) හි ලියා ඇති ප්‍රකාශන භාවිත කොට $(P_0 - P_3)$ සඳහා ප්‍රකාශනයක් $Q, r_1, l_1, \eta, r_2, l_2$ සහ $F$ ඇසුරෙන් ලියා දක්වන්න.

(vi) එනයින් $F$ සඳහා ප්‍රකාශනයක් $Q, r_1, l_1, \eta, r_2, l_2, P_3$ සහ $P_0$ ඇසුරෙන් ලියා දක්වන්න.

(c) ශිරාව තුළ $P_3$ පීඩනය වායුගෝලීය පීඩනයට වඩා 10 mmHg කින් වැඩිය.

(i) $(P_3 - P_0)$, Pa වලින් නිර්ණය කරන්න. රසදියේ (Hg) ඝනත්වය $1{\cdot}36 \times 10^4\,\text{kg m}^{-3}$ වේ.

(ii) $r_1 = 2{\cdot}5$ mm, $l_1 = 50$ mm, $r_2 = 0{\cdot}10$ mm, $l_2 = 60$ mm සහ $\eta = 2{\cdot}0 \times 10^{-3}$ Pa s නම් දියර ඖෂධ $3{\cdot}0 \times 10^{-7}\,\text{m}^3\text{s}^{-1}$ පරිමා ප්‍රවාහ ශීඝ්‍රතාවයකින් ශිරාව තුළට එන්නත් කිරීමට අවශ්‍ය බලයේ විශාලත්වය $F$ නිර්ණය කරන්න. $\pi = 3$ ලෙස ගන්න.
[ඉඟිය: $F$ නිර්ණය කිරීමේදී කුඩා අගයන් සහිත පද දෙක නොසලකා හැරිය හැක.]

(iii) එන්නත් කටුව තුළ දියර ඖෂධයේ ප්‍රවාහ වේගය කොපමණ ද? $\pi = 3$ ලෙස ගන්න.

[දෙවෙනි පිටුව බලන්න.]


Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

(*d*) නවීන ක්ෂේප (jet) ක්‍රමයක (එන්නත් කටු රහිත) සම ස්පර්ශ වන පරිදි තැබූ අධි-පීඩන නැසින්නක් (nozzle) භාවිතයෙන් ශරීරයට දියර ඖෂධ ලබා දේ. දියර ඖෂධයේ පටු ප්‍රවාහයක් සම විනිවිද ගොස් පටක තුළට එම ඖෂධය ලබා දේ. නැසින්නේ විවරයේ අභ්‍යන්තර අරය 4 μm වේ. තිරස්ව ඇති සිරින්ජයේ දියර ඖෂධය පුරවා ඇති විට යම් පීඩනයකදී දියරය නැසින්නේ විවරයෙන් ඉවත්වීම ආරම්භ වේ.

(i) පෘෂ්ඨීක ආතතිය $T$ වන ද්‍රවයක අරය $r$ වූ ගෝලීය මාවකයක් හරහා පවතින අමතර පීඩනය ($\Delta p$) සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න.

(ii) නැසින්නේ විවරයෙන් දියර බිඳුවක් යන්තමින් ගැලවී යන විට නැසින්න සමීපයේ දියර ඖෂධය තුළ තිබිය යුතු පීඩනය $P'$ ගණනය කරන්න. දියර ඖෂධයේ පෘෂ්ඨීක ආතතිය $8{\cdot}0\times10^{-2}\,\mathrm{N\,m^{-1}}$ සහ වායුගෝලීය පීඩනය $1{\cdot}0\times10^{5}$ Pa වේ.

**8.** (*a*) (1) රූපයේ පෙන්වා ඇති පරිදි $S$ උණුසුම් සූත්‍රිකාවකින් විමෝචනය වන ඉලෙක්ට්‍රෝන $A$ විවරය හරහා ගමන් කර පසුව ලෝහමය විවෘත, කුහර සිලින්ඩරයක අක්ෂය ඔස්සේ ගමන් කරයි. පද්ධතිය රික්තයක තබා ඇත. සිලින්ඩරය ධන විභවයක සහ විවරය සෘණ විභවයක පවතින පරිදි $V$ විභව අන්තරයක් සිලින්ඩරය හා විවරය හරහා යොදා ඇත.




(1) රූපය

(i) $A$ විවරය පසු කරන ඉලෙක්ට්‍රෝනවල ප්‍රවේගය නොගිණිය හැකි නම්, සිලින්ඩරය සහ විවරය අතර පරතරය ගමන් කිරීමෙන් පසු $B$ හිදී ඉලෙක්ට්‍රෝනවල චාලක ශක්තිය $K_1$ සඳහා ප්‍රකාශනයක් $V$ සහ ඉලෙක්ට්‍රෝන ආරෝපණය $e$ ඇසුරෙන් ලියා දක්වන්න.

(ii) එනයින් $B$ හිදී ඉලෙක්ට්‍රෝනවල ප්‍රවේගය $v_1$ සඳහා ප්‍රකාශනයක් $e$, $V$ සහ ඉලෙක්ට්‍රෝනයේ ස්කන්ධය $m$ ඇසුරෙන් ලියා දක්වන්න.

(*b*) ලෝහමය සිලින්ඩර සමූහයක් ඒකාක්ෂව එක පෙළට තබා (1) රූපයේ පෙන්වා ඇති සැකසුම විකරණය කිරීම මගින් ඉලෙක්ට්‍රෝන ඉහළ චාලක ශක්තියකට ත්වරණය කළ හැක. මේ ආකාරයේ සැකසුමක් රේඛීය ත්වරකයක් (LINAC) ලෙස හැඳින්වේ. $A$ විවරයෙන් පිටවන ඉලෙක්ට්‍රෝන (2) රූපයේ පෙන්වා ඇති පරිදි ප්ලාවිත නළ ලෙස හැඳින්වෙන 1, 2, 3, 4 ආදී ඒකාක්ෂව තැබූ ලෝහමය සිලින්ඩරවල අක්ෂය ඔස්සේ ගමන් කරයි. ප්ලාවිත නළ $V_{r.m.s} = V$ සහ ඉහළ $f$ සංඛ්‍යාතයක් සහිත ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතා (a.c.) ප්‍රභවයකට සම්බන්ධ කොට ඇත. ප්‍රත්‍යාවර්ත ප්‍රභවයේ එක් අර්ධ චක්‍රයක් තුළ 1 සහ 3 නළ ධන ලෙසද 2 සහ 4 නළ සෘණ ලෙසද පවතින පරිදි එකක් හැර එකක් නළවල විභවයන් ප්‍රතිවිරුද්ධ ධ්‍රැවීයතාවල පවතී. ඊළඟ අර්ධ චක්‍රයේදී ධ්‍රැවීයතාවයන් ප්‍රතිවර්ත වේ. එනම් 1 සහ 3 නළ සෘණ සහ 2 සහ 4 නළ ධන වේ.



(2) රූපය

අර්ධ චක්‍රයකදී $A$ ට සාපේක්ෂව 1 ප්ලාවිත නළය ධනව පවතින විට $A$ තුළින් යන ඉලෙක්ට්‍රෝන ත්වරණය වේ. එවිට 1 නළය වෙත ළඟාවන ඉලෙක්ට්‍රෝනවල ප්‍රවේගය $v_1$ ඉහත (*a*) (ii) හි ඔබ ලියා ඇති ප්‍රකාශනයෙන් ලබා දේ. පළමු නළයේ දිග සාදා ඇත්තේ එයින් ඉලෙක්ට්‍රෝන පිටතට එන විට 1 නළයෙහි විභවය සෘණ බවටත් 2 නළයේ විභවය ධන බවටත් පත්වන ලෙසටය. එබැවින් 1 සහ 2 නළ අතර හිඩැසේදී ද ඉලෙක්ට්‍රෝන නැවත ත්වරණය වේ. ඉලෙක්ට්‍රෝන නළ අතර ඇති හිඩැස්වලදී ත්වරණය වන නමුදු නළ තුළදී නියත ප්‍රවේගවලින් ගමන් කරයි.

(i) නළ තුළදී ඉලෙක්ට්‍රෝන නියත ප්‍රවේගවලින් ගමන් කිරීමට හේතුව කුමක් ද?

(ii) දෙවන නළය වෙත ළඟා වන ඉලෙක්ට්‍රෝනවල ප්‍රවේගය $v_2$ සඳහා ප්‍රකාශනයක් $v_1$ ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

(iii) දෙවන නළය වෙත ළඟා වන ඉලෙක්ට්‍රෝනවල චාලක ශක්තිය $K_2$ සඳහා ප්‍රකාශනයක් $e$ සහ $V$ ඇසුරෙන් ලියා දක්වන්න.

(*c*) මේ අයුරින්ම 2 නළයේ දිග සාදා ඇත්තේ එයින් ඉලෙක්ට්‍රෝන පිටතට එන විට 2 නළයෙහි විභවය ධන සිට සෘණ බවටත් 3 නළයේ විභවය සෘණ සිට ධන බවටත් හැරෙන ලෙසට ය. එබැවින් 2 සහ 3 නළ අතර හිඩැසේදී ද ඉලෙක්ට්‍රෝන නැවතත් ත්වරණය වේ.

(i) තෙවන නළය වෙත ළඟා වන ඉලෙක්ට්‍රෝනවල ප්‍රවේගය $v_3$ සඳහා ප්‍රකාශනයක් $v_1$ ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

(ii) තෙවන නළය වෙත ළඟා වන ඉලෙක්ට්‍රෝනවල චාලක ශක්තිය $K_3$ සඳහා ප්‍රකාශනයක් $e$ සහ $V$ ඇසුරෙන් ලියා දක්වන්න.

(iii) නළ $n$ සංඛ්‍යාවක් ඇත්නම්, $n$ වන නළයෙන් පිටවන ඉලෙක්ට්‍රෝනවල චාලක ශක්තිය $K_n$ සඳහා ප්‍රකාශනයක් ඉහත (*a*)(i), (*b*) (iii) සහ (*c*)(ii) හි පිළිතුරු දෙස බලා හෝ අන් ක්‍රමයකින් ලියා දක්වන්න.



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

(*d*) අනුයාත නළ දෙකක් අතර පරතරය තුළ ඉලෙක්ට්‍රෝන ත්වරණය වන බැවින් ඉලෙක්ට්‍රෝන නළ හරහා ගමන් කිරීමට ගතවන කාලය අධි සංඛ්‍යාත ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතාවයේ ආවර්ත කාලයෙන් හරි අඩකට සමාන විය යුතුය.

(i) එක් එක් ප්ලාවිත නළය හරහා ඉලෙක්ට්‍රෝන ගමන් කිරීමට ගතවන කාලය $t$ සඳහා ප්‍රකාශනයක් ප්‍රත්‍යාවර්ත වෝල්ටීයතාවයේ සංඛ්‍යාතය $f$ ඇසුරෙන් ලියා දක්වන්න.


(ii) එනයින් $n$ වන නළයේ දිග $L_n$, $L_n = \frac{1}{f}\sqrt{\frac{neV}{2m}}$ මගින් ලබා දෙන බව පෙන්වන්න.

(*e*) වෛද්‍ය රේඛීය ත්වරකයක් (medical LINAC) යනු පිළිකා රෝගීන්ගේ බාහිර කදම්බ විකිරණ ප්‍රතිකාර සඳහා බහුලව භාවිත වන උපකරණයකි. අධි ශක්ති X-කිරණ නිපදවීම සඳහා ත්වරණය කරන ලද ඉලෙක්ට්‍රෝන ටංස්ටන් වැනි බැර ලෝහ ඉලක්කයක් සමග ගැටීමට සලස්වයි. මෙම අධි ශක්ති X-කිරණ පිළිකා සෛල විනාශ කිරීමට භාවිත කරයි. වෛද්‍ය රේඛීය ත්වරකයකින් පිටවන ත්වරණය කරන ලද ඉලෙක්ට්‍රෝනවල චාලක ශක්තිය 10 MeV වේ. විමෝචනය වන X-කිරණවල **අවම** තරංග ආයාමය නිර්ණය කරන්න. ($hc = 1{\cdot}24 \times 10^{-3}$ MeV nm)

**9. (A) කොටසට හෝ (B) කොටසට හෝ පමණක් පිළිතුරු සපයන්න.**

**(A) කොටස**

ශුන්‍ය අභ්‍යන්තර ප්‍රතිරෝධයක් සහිත $X$ ප්‍රභවයක් (1) රූපයේ පෙන්වා ඇත. $X$ හි වෝල්ටීයතාවය උෂ්ණත්වය මත රේඛීයව රඳා පවතින අතර 0 °C සිට 100 °C දක්වා වූ උෂ්ණත්ව පරාසයක් සඳහා 0 සිට 20 mA ධාරාවක් ($I$) නිපදවයි. ධාරාව රේඛීයව 0 - 5 V පරාසය අතර වෝල්ටීයතාවයක් බවට පරිවර්තනය කරනු ලබන අතර එය $R$ ප්‍රතිරෝධය හරහා ප්‍රතිදාන වෝල්ටීයතාවයක් ($V$) ලෙස මනිනු ලැබේ.




(1) රූපය

(*a*) (i) $R$ ඕමික ප්‍රතිරෝධයක් නම්, $R$ හි $I - V$ ලාක්ෂණිකය ඇඳ දක්වන්න.

(ii) $R$ ප්‍රතිරෝධයේ අගය කුමක් විය යුතු ද?

(iii) $X$ හි උෂ්ණත්වය 25 °C වන විට ප්‍රතිරෝධකය හරහා පවතින වෝල්ටීයතාවයේ සහ ගලන ධාරාවේ අගයන් ගණනය කරන්න. එනයින් ප්‍රතිරෝධකය තුළ ක්ෂමතා උත්සර්ජනය ගණනය කරන්න.

(*b*) $R_1$ ප්‍රතිරෝධයක් $X$ ට සමාන්තරගතව සම්බන්ධ කර (1) රූපයේ දැක්වෙන පරිපථයේ $BC$ කොටස (2) රූපයේ පරිදි $R_2$ ප්‍රතිරෝධයකින් ප්‍රතිස්ථාපනය කොට ඇතැයි සිතන්න. ඉහත (*a*) (ii) හි ගණනය කළ අගයෙහි $R$ නියතව පවතින බව සලකන්න.




(2) රූපය

(i) ප්‍රභවය $V_S$ වෝල්ටීයතාවයක් නිපදවන විට, $R$ ප්‍රතිරෝධය හරහා ගමන් කරන ධාරාව ($I$) සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න.


(ii) එනයින් ප්‍රභවයේ ධාරාව ($I_S$) සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න.

(iii) ඉහත (*b*) (i) සහ (*b*) (ii) හි ප්‍රකාශන භාවිත කරමින් $R_1 >> (R + R_2)$ නම් $\frac{I_s}{I}$ අනුපාතයට කුමක් සිදුවේ දැයි සඳහන් කරන්න. මෙහි භෞතික වැදගත්කම කුමක් ද?

(*c*) පරිගණක දෘඪ තැටි ධාවකයක (hard disk drive, HDD), පැතලි වෘත්තාකාර තැටියක තැන්පත් කර ඇති තුනී පටලයක කුඩා කලාප චුම්බකනය කිරීම මගින් දත්ත ගබඩා කෙරේ. (3) රූපයේ දැක්වෙන පරිදි, තැටියේ අක්ෂය හරහා ගමන් කරන සිලින්ඩරාකාර දණ්ඩක් තැටිය කරකැවීම සඳහා භාවිත කරයි. තැටිය කැරකෙන විට, තැටියේ ගබඩා කර ඇති තොරතුරු, තැටියට මදක් ඉහළින් තබා ඇති පැත්තක දිග $d$ වන සන්නායක තිරස් සමචතුරස්‍රාකාර පුඩුවක ආකාරයේ වූ කියවන/ලියන හිසෙහි (read/write head) ජනනය වන ප්‍රේරිත විද්‍යුත් ගාමක බලයක් ලෙස කියවනු ලැබේ. තැටිය නියත කෝණික ප්‍රවේගයකින් ($\omega$) භ්‍රමණය වේ. තැටිය කැරකෙන විට, තැටියේ කේන්ද්‍රයේ සිට $r$ මධ්‍යන්‍ය දුරින් පිහිටා ඇති පුඩුවට සමාන ප්‍රමාණයේ හුදකලා චුම්බක කලාපයක් සන්නායක පුඩුවට යටින් ගමන් කරයි. මෙහි $r >>> d$. ඉහළට යොමු වන ස්‍රාව ඝනත්වය $B$ වන ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයක් චුම්බක කලාපය නිපදවයි. ඉහළින් බැලූ විට සමචතුරස්‍රාකාර පුඩුවේ විශාලිත රූපයක් (4) රූපයේ පෙන්වා ඇත. චුම්බක කලාපය මුළුමනින් පුඩුව යටින් පිහිටන විට චුම්බක කලාපයෙන් නිපදවන චුම්බක ක්ෂේත්‍රය පුඩුවේ තලයෙන් ඉවතට යොමු වී ඇත.



(3) රූපය



(4) රූපය

(i) ප්‍රේරිත විද්‍යුත් ගාමක බලය $\xi$ (e.m.f.)- කාලය ($t$) සමග විචලනය වන ආකාරය පහත පරිදි ඇඳ දක්වන්න.

$t_1$ ක්ෂේත්‍රය යන්තම් පුඩුවට ඇතුළු වන කාලය ලෙස,

$t_2$ පුඩුව සම්පූර්ණයෙන්ම ක්ෂේත්‍රය තුළ ඇති කාලය ලෙස, සහ

$t_3$ ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම පුඩුවෙන් ඉවත් වන කාලය ලෙස,



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

(ii) පුඩුව සම්පූර්ණයෙන්ම චුම්බක කලාපය තුළ ඇති විට, ඒ හරහා චුම්බක ස්‍රාවය ($\phi$) සඳහා ප්‍රකාශනයක් $B$ සහ $d$ ඇසුරෙන් ලියා දක්වන්න.

(iii) චුම්බක කලාපයට පුඩුව පසු කිරීමට ගතවන කාලය ($\Delta t$) සඳහා ප්‍රකාශනයක් $d, r$ සහ $\omega$ ඇසුරෙන් ලියා දක්වන්න. චුම්බක කලාපය තැටියේ කේන්ද්‍රයේ සිට $r$ මධ්‍යන්‍ය දුරකින් ඇතැයි උපකල්පනය කරන්න.

(iv) ඉහත ($c$) (ii) සහ ($c$) (iii) කොටස්වල පිළිතුරු භාවිත කරමින් හෝ වෙනත් ආකාරයකින්, පුඩුවෙහි ප්‍රේරිත විද්‍යුත් ගාමක බලයේ විශාලත්වය $\xi$ (e.m.f.) සඳහා ප්‍රකාශනයක් $B, d, r$ සහ $\omega$. ඇසුරෙන් ලියා දක්වන්න.

(v) අරය 62·5 mm වූ වෘත්තාකාර තැටියේ වර්ගඵලයෙන් හරි අඩක් ඒකාකාරව ව්‍යාප්ත වූ හුදෙකලා සමචතුරස්‍රාකාර චුම්බක කලාප $1{\cdot}0 \times 10^{13}$ කින් පුරවා ඇත. අරය 12·5 mm සිලින්ඩරාකාර දණ්ඩේ චුම්බක කලාප නොමැත. චුම්බක කලාපයක පැත්තක දිග $d$ ගණනය කරන්න. $\pi = 3$ සහ $\sqrt{562 \cdot 5} = 24$ ලෙස ගන්න.

(vi) $B = 1{\cdot}0 \times 10^{-3}$ T සහ තැටිය කැරකෙන කෝණික වේගය 540 rad s$^{-1}$ නම්, තැටියේ පරිධියේ ($r = 62{\cdot}5$ mm) පිහිටා ඇති චුම්බක කලාපයක් පුඩුව යටින් ගමන් කරන විට පුඩුවේ ජනනය වන ප්‍රේරිත විද්‍යුත් ගාමක බලය $\xi$ (e.m.f.) ගණනය කරන්න.

## (B) කොටස

($a$) සිලිකන් p-n සන්ධි දියෝඩයක ගුණ සලකා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දියෝඩයේ හායිත ප්‍රදේශයක් සෑදීමට හේතුව කුමක් ද?


(ii) පහත අවස්ථාවලදී දියෝඩයේ හායිත ප්‍රදේශයේ පළලට කුමක් සිදුවේ ද?

I. පෙර නැඹුරුවේදී සහ

II. පසු නැඹුරුවේදී

(iii) දියෝඩයේ ඉතා කුඩා පසු නැඹුරු කාන්දු ධාරාවක් ජනනය වීමට හේතුව කුමක් ද?

($b$) පෙර නැඹුරු සිලිකන් දියෝඩයක දියෝඩ ධාරාව නියතව පවතී නම්, උෂ්ණත්වය සමග දියෝඩ වෝල්ටීයතාවය රේඛීයව පහත වැටේ. සිලිකන් ට්‍රාන්සිස්ටරයක් ($V_{BE} = 0{\cdot}7$ V) සහ සෙනර් දියෝඩයක් ($Z$) සහිත (1) රූපයේ දැක්වෙන පරිපථය, ට්‍රාන්සිස්ටරය සක්‍රීය විධියේ ක්‍රියාත්මක වන විට දියෝඩය ($D$) හරහා නියත $I_D$ ධාරාවක් තබා ගැනීමට භාවිත කළ හැකිය.



(1) රූපය


(i) පරිපථයේ සෙනර් දියෝඩයේ අරමුණ කුමක් ද?

(ii) සෙනර් වෝල්ටීයතාව $V_Z$ නම්, $I_E, V_Z$ සහ $V_{BE}$ ඇසුරින් $R_E$ සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න.

(iii) පරිපථයට $I_D = 20$ mA නියත ධාරාවක් නිපදවීමට අවශ්‍ය නම්, $R_E$ සඳහා සුදුසු අගයක් ගණනය කරන්න. $V_Z = 5{\cdot}7$ V ලෙස ගන්න. ගණනය කිරීමේදී $I_E$ සම්බන්ධයෙන් ඔබ කළ උපකල්පනය ලියා දක්වන්න.

(iv) $V_{CC} = +12$ V සහ $V_Z = 5{\cdot}7$ V නම්, පරිපථය නියත ධාරා ප්‍රභවයක් ලෙස ක්‍රියා කරන බව පෙන්වන්න. සිලිකන් දියෝඩය හරහා ඉදිරි නැඹුරු වෝල්ටීයතා බැස්ම 0·7 V වේ.

($c$) ඉහත ($b$) හි දක්වා ඇති දියෝඩ වෝල්ටීයතාවයට සමාන කුඩා වෝල්ටීයතාවයක් වර්ධනය කිරීම සඳහා (2) රූපයෙහි දැක්වෙන කාරකාත්මක වර්ධක පරිපථය භාවිත කළ හැක.



(2) රූපය

(i) රූපය (2) හි දැක්වෙන කාරකාත්මක වර්ධකයේ වින්‍යාසය කුමක් ද?

(ii) පළමුවන ස්වර්ණමය නීතිය සඳහන් කරන්නේ, කාරකාත්මක වර්ධකයෙහි ප්‍රදාන අග්‍ර තුළට ධාරාවක් ගලා නොයන බවයි. මෙයට හේතුව කුමක් ද?

(iii) දෙවන ස්වර්ණමය නීතිය සඳහන් කරන්නේ, කාරකාත්මක වර්ධකයෙහි ප්‍රදාන අග්‍ර අතර වෝල්ටීයතා වෙනස ශුන්‍ය බවයි. එය ප්‍රායෝගිකව සාක්ෂාත් කරගන්නේ කෙසේ ද?

(iv) ස්වර්ණමය නීති දෙක යෙදීමෙන්, ප්‍රතිදාන වොල්ටීයතාව $V_o$ සඳහා ප්‍රකාශනයක්, කුඩා ප්‍රදාන වෝල්ටීයතාවය $V_i, R_1$ සහ $R_2$ ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

(v) 0 සහ 0·7 V අතර කුඩා ප්‍රදාන වෝල්ටීයතා, 0 V සහ 3·5 V අතර ප්‍රතිදාන පරාසයේ අගයන් බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය නම්, කාරකාත්මක වර්ධකයෙහි වෝල්ටීයතා ලාභය නිර්ණය කරන්න.

(vi) 0·7 V හි ඇති කුඩා ප්‍රදාන වෝල්ටීයතාවය, එක් $1\,^{\circ}C$ යට 2 mV බැගින් උෂ්ණත්වය සමග රේඛීයව පහත වැටේ. $V_i$ හි උෂ්ණත්වයේ $10\,^{\circ}C$ වැඩිවීමකට අනුරූප වන කාරකාත්මක වර්ධකයෙහි ප්‍රතිදාන වෝල්ටීයතාවය ගණනය කරන්න.

(vii) ඕම් පරාසයේ $R_1$ සහ $R_2$ අගයන් තෝරා ගැනීමෙන් කාරකාත්මක වර්ධක පරිපථයේ වෝල්ටීයතා ලාභය සැකසිය හැක. කෙසේ වෙතත්, ප්‍රායෝගිකව කාරකාත්මක වර්ධක පරිපථයේ kΩ පරාසයේ හෝ ඉහළ ප්‍රතිරෝධක අගයන් භාවිත කරයි. පරිපථයේ විශාල ප්‍රතිරෝධක අගයන් භාවිත කිරීමට හේතුව කුමක් ද?

**10. (A) කොටසට හෝ (B) කොටසට හෝ පමණක් පිළිතුරු සපයන්න.**

**(A) කොටස**

පානීය ජල හිඟයට විසඳුමක් ලෙස එක්සත් අරාබි එමීර් රාජ්‍යය (UAE) පාවෙන අයිස් කුට්ටි (iceberg) ව්‍යාපෘතිය හඳුන්වා දීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතියේ සංකල්පය වන්නේ ඇන්ටාර්ක්ටිකාවේ සිට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පර්සියානු ගල්ෆ් මුහුදු කලාපයට විශාල පාවෙන අයිස් කුට්ටියක් ගෙනවිත් එමගින් පානීය ජලය නිෂ්පාදනය කිරීමයි. ඇන්ටාර්ක්ටිකාවේ ඇති පරිමාව $1{\cdot}0 \times 10^7\ m^3$ වන විශාල ඝනකයක හැඩයක් ඇති අයිස් කුට්ටියක් විශාල අදින බෝට්ටුවක (tugboat) ආධාරයෙන් ඇදගෙන යා යුතුව ඇත. ඇන්ටාර්ක්ටිකාවේ හා පර්සියානු ගල්ෆ් හි මුහුදු ජලයේ සහ අයිස්වල මධ්‍යන්‍ය ඝනත්ව පිළිවෙළින් $1000\ kg\ m^{-3}$ සහ $900\ kg\ m^{-3}$ ලෙස උපකල්පනය කරන්න.

(*a*) (i) අයිස් කුට්ටියේ ආරම්භක සම්පූර්ණ ස්කන්ධය කොපමණ ද?

(ii) මුහුදේ මතුපිට පෘෂ්ඨයට පහළින් අයිස් කුට්ටියේ ගිලී ඇති කොටසේ පරිමාවේ ප්‍රතිශතය ගණනය කරන්න.

(iii) අයිස් කුට්ටිය පර්සියානු ගල්ෆ්හි ඇති විට එහි ආරම්භක ස්කන්ධයෙන් 80 %ක් අයිස් ලෙස ඉතිරිව පවතී නම්, මෙම අයිස් කුට්ටිය භාවිතයෙන් ජලය ඝනමීටර ($m^3$) කොපමණ ප්‍රමාණයක් නිපදවිය හැකි ද?

(*b*) පර්සියානු ගල්ෆ් මුහුදට ගෙනෙන ලද අයිස් කුට්ටිය 4·0 cm ක ඝනකමක් ඇති *A* නම් වූ පරිවාරක ද්‍රව්‍යයකින් සම්පූර්ණයෙන්ම ඔතනු ලැබේ. අයිස් කුට්ටියේ මුහුදු ජල මට්ටමට ඉහළින් ඇති කොටස 4·0 cm ක ඝනකමකින් යුත් *B* නම් වූ තවත් පරිවාරක ද්‍රව්‍යයකින් ආවරණය කරනු ලැබේ. ජල මට්ටමට පහළින් ඇති මුහුදු ජලයේ මධ්‍යන්‍ය උෂ්ණත්වය $20\,^{\circ}C$ යැයි ද වායුගෝලීය උෂ්ණත්වය $30\,^{\circ}C$ යැයි ද උපකල්පනය කරන්න. *A* පරිවාරක ද්‍රව්‍යයෙහි තාප සන්නායකතාවය $0{\cdot}2\ W\,m^{-1}K^{-1}$ වන අතර *B* පරිවාරක ද්‍රව්‍යයෙහි තාප සන්නායකතාවය $0{\cdot}1\ W\,m^{-1}K^{-1}$ වේ. අයිස් කුට්ටියට ඝනකයක හැඩයක් ඇති බවත් අයිස් කුට්ටියේ පිටත තට්ටුවේ උෂ්ණත්වය $0\,^{\circ}C$ බවත් උපකල්පනය කරන්න. පරිවාරක ද්‍රව්‍යවල ස්කන්ධයන් නොසලකා හරින්න. ආන්ත ආවරණවල බලපෑමක් නැති බව ද සියලු පෘෂ්ඨයන්ට ලම්බකව තාපය ගලායන බව ද උපකල්පනය කරන්න.

(i) අනවරත අවස්ථාවේදී කිසියම් ද්‍රව්‍යයක් හරහා තාපය ගලායාමේ ශීඝ්‍රතාවය *Q* සඳහා ප්‍රකාශනයක් ලියා ඔබ භාවිත කළ සියලුම සංකේත හඳුන්වන්න.

(ii) ඉහත (*a*) (iii) හි ඇති අයිස් ඝනකයේ පැත්තක දිග (*l*) සොයන්න.

- පහත (iii), (iv), (v) සහ (vi) කොටස්වල පිළිතුරු විද්‍යාත්මක අංකනයෙන් දශම ස්ථාන දෙකකට වටයන්න. 9 පිටුව ආරම්භයේ ඇති සටහන බලන්න.

(iii) ඝනකාකාර අයිස් කුට්ටියේ

I. ජල මට්ටමෙන් ඉහළ ඇති සහ

II. ජල මට්ටමෙන් පහළ ඇති

පෘෂ්ඨික වර්ගඵලය ගණනය කරන්න.

(iv) මුහුදේ මතුපිට ජල මට්ටමෙන් පහළ පිහිටි අයිස් කුට්ටියේ කොටස මගින් මුහුදු ජලයෙන් තාපය අවශෝෂණය කරනු ලබන ශීඝ්‍රතාවය ගණනය කරන්න.

(v) මුහුදේ මතුපිට ඇති ජල මට්ටමෙන් ඉහළ පිහිටි අයිස් කුට්ටියේ කොටස මගින් වාතයෙන් තාපය අවශෝෂණය කරනු ලබන ශීඝ්‍රතාවය ගණනය කරන්න.

(vi) අයිස් කුට්ටියේ අයිස් දියවීමෙන් නිපදවන ජලය පරිභෝජනය සඳහා බෙදා හැරීමට යොදා ගනී. ආරම්භයේ දී එක් දිනක් තුළ $0\,^{\circ}C$ ඇති ජලය ඝනමීටර් කොපමණ ප්‍රමාණයක් නිපදවන්නේ ද? අයිස් හි විලයනයේ විශිෂ්ට ගුප්ත තාපය $3{\cdot}0 \times 10^5\ J\,kg^{-1}$ ලෙස සහ දින $1 = 9{\cdot}0 \times 10^4$ s ලෙස ගන්න.



Physics Class
Dr.Theekshana Nayanajith
0763456669

**(B) කොටස**

(*a*) විකිරණ මාත්‍රාව මැනීම සඳහා ඒකක ස්කන්ධයකට පටක අවශෝෂණය කරන විකිරණ ශක්ති ප්‍රමාණය භාවිත කරයි. විකිරණ මාත්‍රාවේ මානය ලියන්න.

(*b*) විකිරණශීලී නියැදියක සක්‍රියතාව යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(*c*) විකිරණශීලී ක්ෂයවීමේ (ඝාතීක්කරණ) නියමය **වචන වලින්** ලියන්න.

(*d*) X පරමාණුවෙහි න්‍යෂ්ටියේ සංකේතාත්මක අංකනය $^{A}_{Z}X$ මගින් දෙනු ලැබේ.

(i) මෙහි $Z$ මගින් අදහස් කරන්නේ කුමක් ද?

(ii) මෙහි $A$ මගින් අදහස් කරන්නේ කුමක් ද?

(*e*) ලැසි මන්දගාමී නියුට්‍රෝනයක් ග්‍රහණය කර ගන්නා U-235 න්‍යෂ්ටියේ විඛණ්ඩන ප්‍රතික්‍රියාව පහත පරිදි ලිවිය හැක.

$$^{235}_{92}\text{U} + \text{n} \rightarrow {}^{148}_{x}\text{La} + {}^{85}_{35}\text{Br} + y\text{n}$$

අදාළ පරමාණුක ස්කන්ධ පහත දැක්වේ.

$^{235}\text{U} = 235{\cdot}124$ u     $^{148}\text{La} = 147{\cdot}961$ u     $^{85}\text{Br} = 84{\cdot}930$ u

p = 1·007 u     n = 1·009 u     1 u = 932 MeV/$c^2$

ඇවගාඩ්රෝ අංකය $N_A = 6{\cdot}0 \times 10^{23}\,\text{mol}^{-1}$ ලෙස ගන්න. $c = 3{\cdot}0 \times 10^{8}\,\text{m s}^{-1}$ සහ $1\,\text{MeV} = 1{\cdot}6 \times 10^{-13}\,\text{J}$ වේ.

(i) ඉහත න්‍යෂ්ටික ප්‍රතික්‍රියාවේ $x$ සහ $y$ හි අගයන් මොනවා ද?

(ii) U-235 න්‍යෂ්ටියේ බන්ධන ශක්තිය ගණනය කරන්න. ඔබගේ පිළිතුර MeV වලින් ආසන්න පූර්ණ සංඛ්‍යාවට දෙන්න.

(iii) ඉහත න්‍යෂ්ටික ප්‍රතික්‍රියාවෙන් නිකුත්වන ශක්තිය ගණනය කරන්න. ඔබගේ පිළිතුර MeV වලින් ආසන්න පූර්ණ සංඛ්‍යාවට දෙන්න.

(*f*) ඇතැම් කාලසීමාවලදී ජල විදුලිය ඉල්ලුමට සරිලන පරිදි ප්‍රමාණවත් නොවන බැවින් පාවෙන න්‍යෂ්ටික බලාගාරයක් යොදාගෙන විදුලිය නිපදවීමට යෝජනා කර ඇත. පාවෙන න්‍යෂ්ටික බලාගාරයේ ඇති එක් ප්‍රධාන වාසියක් වන්නේ, මනා පුහුණුව ලත් විශේෂඥයින්ගෙන් සැදුම්ලත් ඉතා දියුණු කර්මාන්තශාලාවල එය එකලස් කර, බලශක්ති අවශ්‍යතාවය උග්‍ර ස්ථානයට ගෙන ඒමට හැකි වීමයි.

එවැනි වෙරළෙන් පිටත මුහුදේ නැංගුරම් ලා ඇති න්‍යෂ්ටික බලාගාරයක් නිර්මාණය කර ඇත්තේ U-235 ප්‍රතික්‍රියාකාරක ද්‍රව්‍යය ලෙස භාවිත කර 400 MW ක විදුලි බලයක් ප්‍රධාන විදුලි සැපයුමට ලබාදීම සඳහා ය. එම න්‍යෂ්ටික බලාගාරය මගින් නිපදවෙන න්‍යෂ්ටික ශක්තියෙන් 75 %ක් විදුලිය බවට පරිවර්තනය කරනු ලබන අතර වසර 10ක් තුළ අඛණ්ඩව විදුලිය ජනනය කරයි. U-235 න්‍යෂ්ටියකින් මුදා හරින මධ්‍යන්‍ය ශක්තිය (*e*) (iii) කොටසින් ලබාගත් අගයට සමාන ලෙස ගන්න. වසර 1 = $3{\cdot}3 \times 10^{7}$ s ලෙස ගන්න.

(i) අයින්ස්ටයින්ගේ ස්කන්ධ-ශක්ති තුල්‍යතා සමීකරණය ලියා භාවිත කරන සංකේත හඳුන්වන්න.

(ii) වසර 10ක් තුළ ජනනය කළ න්‍යෂ්ටික ශක්තියට අනුරූප **තුල්‍ය** ස්කන්ධය ගණනය කරන්න. ඔබගේ පිළිතුර ග්‍රෑම් (g) වලින් ආසන්න පූර්ණ සංඛ්‍යාවට දෙන්න.

(iii) වසර 10 තුළදී විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා න්‍යෂ්ටික බලාගාරය තුළ වැය වූ U-235 ස්කන්ධය ගණනය කරන්න. ඔබගේ පිළිතුර කිලෝග්‍රෑම් (kg) වලින් ආසන්න පූර්ණ සංඛ්‍යාවට දෙන්න.

(iv) ඉහත ගණනයේ දී U-235 හි ක්ෂයවීම සැලකිල්ලට ගැනීම අත්‍යවශ්‍ය **නොවන්නේ** ඇයි? U-235 හි අර්ධ-ආයු කාලය වසර $7{\cdot}0 \times 10^{8}$ කි. කිසිදු ගණනයක් කිරීමෙන් වළකින්න.

* * *

Physics Class
Dr.Theekshana Nayanajith
0763456669